## 2014 – 08 – 05 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

| | | |
|---|---|---|
| ☞ | ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| ☞ | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ☞ | ඒ. පී. ලක්ෂමී හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ජේ. ඩබ්. හාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ☞ | කේ. පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

නොපැමිණීම

| | | |
|---|---|---|
| ☞ | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **09.40** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

**(01)**

**01:01** **2014 – 07 – 01** දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2014 – 07 – 01 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2014 – 07 – 01 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන **නැත**

**(03)** ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** **‘** මෝදර දේවාලයේ ඇසළ මහා පෙරහැර දිනවල වෙනත් උත්සව සහ සංදර්ශන පැවැත්වීමට අවසර නොදීම පිළිබඳවයි **’** මැයෙන් අම්බලන්ගොඩ මෝදර දේවාලයේ ගරු ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

මෝදර දේවාලයේ 70 වන වාර්ෂික ඇසළ මහා පෙරහැර සහ උත්සවය 2014 සැප්තැම්බර් මස 09 වන දින සිට 14 දින දක්වා පැවැත්වීමට තිරණය කළ බවත් පසුගිය වසරේ 69 වන ඇසළ මහා පෙරහැර සහ උත්සවය සඳහා ලබාදුන් සුවිශේෂී සහය අගය කොට සලකන බවත් දන්වා තිබූ අතර මෙවර ඇසළ මහා පෙරහැර සහ උත්සවය සැප්තැම්බර් මස 12 සහ 13 යන දින වල පැවැත්වෙන බැවින් මෙම දින වල අම්බලන්ගොඩ නගර සභා ශාලාව සහ ක්‍රීඩාංගනය වෙනත් කිසිදු උත්සවයක් හෝ සංදර්ශනයක් සඳහා ලබා නොදෙන ලෙසත් අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ද එවන් කාර්යයක් සඳහා අනුමැතිය ලබා නොදෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **2014 සැප්තැම්බර් මස 12 සහ 13 යන දෙදින තුළ නගර සභා ශාලාව සහ ක්‍රීඩාංගනය කිසිදු උත්සවයක් හෝ සංදර්ශන පැවැත්වීම සඳහා ලබා නොදීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**3:2** **‘**නගර සභා ශාලාව වෙන්කරවා ගැනීම සඳහා **’** මැයෙන් අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ පොලිස් වසමේ සිවිල් ආරක්ෂක කමිටු වැඩමුළුවක් 2014.07.07 දින පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බවත් එබැවින් එදින පැය 10 00 සිට පැය 18 00 දක්වා මෙම වැඩමුළුව සාර්ථක කරගෙන යාම සඳහා නගර සභා ශාලාව පුටු 1000 සහ සියළු පහසුකම් සහිතව මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට කටයුතු කරදෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට 2014.07.07 දින පැය 10 00 සිට පැය 18 00 දක්වා නගර සභා ශාලාව ,පුටු 500 සහ සියළු පහසුකම් සහිතව මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභා අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**3:3** **‘** කොඩිකනු හා පුටු ලබා ගැනීම සඳහා **’** මැයෙන් අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ අර්ධ වාර්ෂික පරීක්ෂණය 2014.07.26 දින පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇති බැවින් 2014.07.25 වන දිනට කොඩි කණු 25 ක් සහ පුටු 100 ගාස්තු අය කිරීමකින් තොරව ලබා දීමට කටයුතු කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට 2014.07.25 වන දිනට කොඩි කණු 25 ක් සහ පුටු 100 ගාස්තු අය කිරීමකින් තොරව සභාවේ අනුමැතියට යටත්ව ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**3:4** ' අම්බලන්ගොඩ රුහුණු කවි සමාජයේ වාර්ෂික උත්සවය සඳහා අම්බලන්ගොඩ පුරහල නොමිලයේ ලබා ගැනීමට ' මැයෙන් අම්බලන්ගොඩ රුහුණු කවි සමාජයේ ලේකම්තුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2014.09.28 වැනි දින පැවැත්වීමට අපේක්ෂිත අම්බලන්ගොඩ රුහුණු කවි සමාජයේ වාර්ෂික උත්සවය සඳහා එදින පෙ.ව 8.00 සිට ප.ව 8.00 දක්වා පුරහල සහ පුටු ආදිය නොමිලයේ ලබා දෙන ලෙස ඉල්ලා තිබූ අතර පසු ගිය වසරේ දී දැක්වූ සහයෝගයට කෘතඥ පූර්වක ස්තූතිය පුදකොට තිබුණි.

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ රුහුණු කවි සමාජයට 2014.09.28 වන දින පෙ.ව 8.00 සිට ප.ව 8.00 දක්වා පුරහල සහ පුටු ආදිය නොමිලයේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

- **පෙ. ව. 09.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා සභාවට පැමිණෙන ලදී.**

**3:5** ' නිවසට පැමිණෙන පාර සාදා ගැනීම ' මැයෙන් අම්බලන්ගොඩ කන්ද මාවත එම්. ඩබ්. හේමලතා මිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී

34/A කන්ද මාවත ,අම්බලන්ගොඩ, යන ලිපිනයේ පදිංචි එම්. ඩබ්. හේමලතා යන අයගේ නිවසට ප්‍රවේශ වීම සඳහා පාරක් නොමැති බවත් එම නිවැසියන් දැනට භාවිතා කරනුයේ එම්. ඩබ්. හේමලතා යන අයගේ ස්වාමිපුරුෂයාගේ මවගේ නිවසට ප්‍රවේශ වන මාර්ගය බවත් එය ඔවුන්ට දැඩි අපහසුතාවයක් බැවින් ඔවුන්ගේ නිවසට පිටු පසින් ඇති සිරි නිකේතනාරාම පාරේ ඇති බැම්ම කෙලවරින් ඔවුන්ගේ නිවසට ප්‍රවේශ වීම සඳහා පාරක් සාදා ගැනීමට අනුමැතිය සහ නගර සභාවේ කිසියම් හෝ අනුග්‍රහයක් ඉල්ලා තිබූ අතර ඇයගේ නිවස ප්‍රතිසංස්කරණය කිරීමට ඉල්ලුම් පත්‍රයක් නගර සභාවට යොමු කිරීමට අපේක්ෂා කරණ බවත් එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මෙම මාර්ගය අවශ්‍ය බවත් සඳහන් කර තිබුණි.

- **පෙ. ව. 09.50 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. භාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය සභාවට පැමිණෙන ලදී.**

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධ තාක්ෂණ සේවා නිළධාරී වාර්තාව ලැබිලා තියෙනවා. මෙම ස්ථානයට යාමට දැනට භාවිතා කරනුයේ අසල නිවසක පාරය.මෙම නිවසට නිත්‍යානුකූලව ඇති පාර සිරිනිකේතනාරාම පාර බවත් නමුත් මෙම මාර්ගය හා ඉඩම්

කරුගේ ඉඩම අතර ඉතා උස් මට්ටමක් පවති. ඒ අනුව එය පහත් කර රැම්ප් එකක් ආකාරයට මාර්ගය සකස් කිරීම නිර්දේශ කරන අතර මේ සඳහා වන වියදම් ඉල්ලුම් කාරිය විසින් දැරියයුතු බවත් ඒ සඳහා අනුමැතියත් ඉල්ලා සිටිමි.

මෙතන සිරිනිකේතනාරාම පාර කොනේම ලොකු බැම්මක් බැඳලා තියෙනවා පන්සලත් එක්කම.ඒ ගොල්ලන්ගේ නිවසට යන්න පාර ලකුණු කරලා තියෙන්නේ සිරි නිකේතනාරාම පාරෙන්. නමුත් මෙතෙක් කල් මේ ගොල්ලො කන්ද මාවත ඇතුලෙන් උඩින් ඇවිල්ලා තමයි ගිහින් තියෙන්නේ.මේ නිසා බැම්ම කඩලා පාර සාදා ගැනීම සුදුසු බව කියලා තියෙනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලලා තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

මෙහි බරපතල අවදානම් තත්වයක් තියෙනවා රැම්ප් එකක් කියන්නේ සභාපතිතුමණි වර්ෂාවට ලිස්සනවා ත්‍රීවිල් යනවා ළමයි බයිසිකල් වල යනවා. බරපතල අවදානම් තත්වයක් උදාවෙනවා. . දෙන එක හොඳයි නමුත් රැම්ප් එකකින් පුලුවන්ද පාරකින් කරන දේ කරන්න. මොකද ළමයි බයිසිකල් පදින එක අපට නවත්වන්න බෑ. අවදානම් තත්වයක් නැද්ද?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාක්ෂණසේවා නිළධාරිනිය මේ ගැන මොකද කියන්නෙ

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

එතකොට පඩි පෙළකට යන්න පුළුවන්නේ....එයා අකමැති වුනාට බැහැනේ. අපි වග කියන්න ඕනනේ මොනවා හරි වුනොත්.එහෙම නොවේ. එයා ගැන නොවේ කතා කරන්නේ.සමස්ථ ජනතාව ගැනම.පොඩි ළමයින්ට ඕවා ගැන අවබෝධයක් නෑ. සෙල්ලම් කරනවා බයිසිකල් පදිනවා....රැම්ප් එකේ ලිස්සලා යනවා. අතුරු ප්‍රතිඵල මං මේ කතා කරන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සරත් මන්ත්‍රීතුමා මේකේ මේ ගෙදරට විතරයි ඇත්තටම යන්න බැරි.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ඔව් නමුත් හැමෝම පාවිච්චි කරන්න ගන්නවනේ දුන්නම

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නෑ මන්ත්‍රීතුමා යන්න පුළුවන් මේ ගෙදරට විතරයි

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

එයාගේ ගේ පිටුපසින්

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔව් එයාගේ ගේ පිටුපස්සෙන්. පාරක් නෑ ඇත්තටම. ඒ වුනාට පඩි පෙලක් තියෙනවා. එයාලට යන්න පඩි පෙළක් නැද්ද?

**ගරු නගර සභා මන්ත්‍රී කේ. පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා කතා කරමින්**

ගරු සභාපති තුමණි පඩි පෙළක් එහා කොනේම තිබුණා. ඒක තියෙනවා එහෙමම

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

මමත් ඒක දෙන එකට එකගයි.මම කියන්නේ ඒකෙන් ඇතිවන අවදානම් තත්වය පහවන ආකාරයට දෙයක් කරන්න කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සරත් මන්ත්‍රිතුමා එයාගේ ඉඩම ඇතුලෙන් දැන් මේක හදන්නේ. එතකොට එයාට පුළුවන්නේ ගේට්ටුවක් දාගන්න.තාක්ෂණසේවා නිළධාරිනියගේ උපදෙස් පරිදි කටයුතු කරන්න.හැබැයි අලුත් ප්‍රශ්න නිර්මාණය කරන්න එපා. මතක තියාගන්න. මොකද බැම්මත් කඩලා එපාර බැම්මත් නැති වෙනවා පාරත් නැති වෙනවා. වලව්වේ ඉඩමේ එක්කෙනා අර කාණුව බදින්න වත් දුන්නෑ නේද? කර්මාන්ත අධිකාරිගේ උපදෙස් පරිදි මෙය ඉටු කරගන්න දෙනවා ඇත්තටම මෙයාට පාරක් වෙන් කරලා දෙන්න තිබුණේ කන්ද මාවතෙන්. මොකද මේක නගර සහා නිවාස යෝජනා ක්‍රමය. එයාට පාර තියෙන්නේ උඩින් ඇත්තටම. යන්න බෑ. ඉතින් සාධාරණ විසඳුමක් දෙන්න එපැයි. විරුද්ධත්වයක් නැති නිසා අපි ඒක කරගන්න දෙමු. .

**තීරණය**

☞ **කර්මාන්ත අධිකාරිගේ නිර්දේශය ,උපදෙස් සහ අධීක්ෂණය පරිදි 34/A කන්ද මාවත ,අම්බලන්ගොඩ, යන ලිපිනයේ පදිංචි එම්. ඩබ්. හේමලතා යන අයගේ නිවසට ප්‍රවේශ වීම සඳහා ප්‍රවේශ මාර්ගය සකස්කර ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.**

**3:6** **‘** අනවසරයෙන් නගරසභා භූමියක් අල්ලා ගැනීම පිළිබඳව **’** මැයෙන් අම්බලන්ගොඩ ධම්මකුසල මාවත නගර සභා නිවාස වාසීන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සහා නිවාස සංකීර්ණය ඉදිරියෙහි පිහිටා ඇති ලොට් අංක 12,පර්චස් 4.37 ක භූමි ප්‍රමාණය පොදු කටයුතු වෙනුවෙන් වෙන් කරන ලද භූමි ප්‍රමාණයක් බවත් නගර සහා නිවාස සංකීර්ණයේ නිවාස අංක 10 හි පදිංචි ටී.ඩබ්. චින්තක යන අය විසින් අනවසරයෙන් මෙහි වැසිකිළි වලක් ඉදිකරමින් සිටින බවත් මීට පෙරද එම භූමියේ ඔවුන් වැසිකිලි වලක් ඉදිකර ඇති බවත් ටී.ඩබ්. චිරන්ත විසින් මෙම ඉඩම් කැබැල්ල බදු ක්‍රමයක් යටතේ ඉල්ලා ලිපියක් නගර සභාවට යොමු කර ඇති බවත් එනිසාවෙන් නගර සහා නිවාස සංකීර්ණයේ සියලුම දෙනාගේ පොදු කටයුතු සඳහා වන භූමිය අහිමි වීමේ තර්ජනයක් පවතින බැවින් සියලුම නිවාස හිමියන්ගේ පොදු අවශ්‍යතාවන්ට ඇති භූමිය එක් පුද්ගලයකුගේ අවශ්‍යතාවකට ලබා නොදී අනවසර ඉදිකිරීම් ඉවත් කොට එම භූමියේ මායිම් සුද්ද කර නිවාස සංකීර්ණයේ සියලුම දෙනාගේ පොදු අවශ්‍යතා වෙනුවෙන් භාවිතා කිරීමට සුදුසු පරිදි සකස්කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පසු ගිය සභාවෙදි ධම්ම කුසල මාවතේ මෙම ඉඩම මේ අයට ලබා දීමට සභා තීන්දුවක් ගත්තා. ඒ සම්බන්ධයෙන් විරෝධතාවය පල කරලා නව දෙනෙක් අත්සන් කරලා ලිපියක් යොමු කරලා තියෙනවා. නිවාස දහයයි තියෙන්නේ. මේ සම්බන්ධයෙන් සභාවේ අදහස කුමක්ද ?

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමණි මං හිතන්නේ අපි ගිය සභාවේදීත් මේ ගැන සාකච්ජා කළා. ඉල්ලීමක් අනුව මේ සභාව තීරණය කළා මේ ඉල්ලුම් කරුවන්ට බදු ක්‍රමයක් යටතේ මෙම ඉඩම් කැබැල්ල ලබා දීමට. නමුත් ඊට පසුදාම ඊට විරුද්ධව තවත් නව දෙනෙක් මේ සභාවට ඇවිල්ලා මේක එයාලට පොදු කටයුතු වලට තියෙන්නේ කියලා ඉල්ලීමක් කරනවා සභාපතිතුමණි මේය නතර කරන ලෙස. මෙය නිවාස දහයක් තියෙන තැනක එක කට්ටියක් මේක එයාලට දෙන්න කියලා ඉල්ලීමක් කරනවා අනෙක් නවදෙනාම මේකට විරුද්ධතාවය ප්‍රකාශ කරලා මේ සභාවේ නැවත වරක් ඒගොල්ලන්ගේ මේ පොදු කටයුතු සඳහා වෙන් කරන ලද බිම් කැබැල්ල ලබා දෙන්න කියලා ඉල්ලනවා. ගරු සභාපතිතුමණි මම හිතන්නේ අපි මහජන නියෝජිතයින් විදියට සාමාන්‍යයෙන් සෑම ඉඩම් කටයුත්තක් කිරීමේදී අපි සභාවෙන් දුන්නත් පොදු කටයුතු සඳහා කොටසක් වෙන් කරනවා. ඒ කොටස තමයි මොන යම් හේතුවක් නිසා දිලා තියෙන්නේ. මං හිතන්නේ අනෙක් නව දෙනත් මේ කටයුත්තට කලින්ම විරෝධතාවය ප්‍රකාශ කළා නම් මේ සභාවේ මේ වගේ තිරණයක් ගන්න වෙන්නෑ. ගරු සභාපති තුමණි නමුත් එය අද සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා අද වෙනස් තත්වයකට පත්වෙලා තියෙනවා.

මම විශේෂයෙන්ම කණගාටු වනවා මම මේ ප්‍රදේශයේ නොසිටියත් මම නගරයේ එහා කොනේ පදිංචි වෙලා හිටියත් මන්ත්‍රීවරයෙක් විදියට මම මේ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරද්දි නිශ්ශබ්දව ඉදීම පිළිබද. මොකද අදාල පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ඉන්නවා මේ ප්‍රදේශයේ .සම්පූර්ණ විස්තර ඔවුන් දන්නවා.නමුත් මෙම ලිපිය ඉදිරිපත් කිරීමේදි ගරු සභාව අපහසුතාවයට පත්කිරීමට විම සම්බන්ධවයි මම මේ නැගී සිටියේ .එනිසා මම හිතනවා මේකට යම් කිසි වාර්තාවක් අරගෙන ඔබතුමා මේක සාමකාමීව විසදන්න අවශ්‍ය උපදෙස් ලබාගන්නවාය කියලා.මේක දීලද සභාපතිතුමණි මේ වන විට.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභා තින්දුව පමණයි. අත්සන් කරලා නෑ තාම

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

නැවත වරක් මේකට නිළධාරින් යවා වාර්තාවක් ලබාගෙන මේක විසදන්න කටයුතු කරන්න කියලා ඉල්ලනවා සභාපතිතුමණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණි ගියවර සභාව විසින් චින්තක මහතාට ලබාදෙන්න තිරණය කළ ඉඩම ඇත්තටම පොදු කටයුතු සඳහා තිබුණේ.මීට පෙර සභාවාර කිහිපයකදීම ඔය බිම් කොටස බදු ක්‍රමය යටතේ කිහිප දෙනෙක්ම ඉල්ලලා තිබුණා.අපි ඒ වන විට සමුපකාරයට ගොඩනැගිල්ලක් හදාගන්න දිලා තිබුණේ.සමුපකාරයෙන් ඒ සඳහා නිසි ප්‍රතිචාරයක් නොදක්වපු නිසා නැවතත් මේ අය මෙම ඉඩම බදු ක්‍රමයක් යටතේ ඉල්ලලා තියෙනවා. එතන තියෙන්නේ නිවාස දහයයි. ඉන් නව දෙනෙක්ම මීට විරෝධතාවය පල කරලා අපටත් ලිපි එවලා තියෙනවා. එනිසා මම හිතනවා ගිය සභාවෙදි දීපු බිම් කොටස නැවතත් මේ නිවාස දහයෙම අයට පොදු කටයුතු සඳහා දෙනවනම් හොඳයි කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

අපි සභාවේ තීන්දු තිරණ දෙන්නේ මෙතනට එන තොරතුරු මත. ඒ අවස්ථාවෙදි අපි එය සාධාරණ ලෙස දැක්කා. නමුත් මේ වන විට අනෙක් නිවැසියන්ට එය බලවත් අසාධාරණයක් කියලා ඔවුන් අපි සමග පවසමින් අපට ලිපිත් ඉදිරිපත් කළා.ඒ අවස්ථාවේ අපි දැනගෙන හිටියේ නෑ මින් අගතියට පත්වන පාර්ශවයක් ඉන්නවා කියලා.නගර සභා නීතිය අනුවත් යම් කිසි භූමියක් කැබලි කිරීමේදි පොදු කටයුතු සඳහා බිම් කොටසක් වෙන් කරනවා.ඒ කොටස තමයි මේ ඉල්ලලා තියෙන්නේ. එනිසා නිත්‍යානුකූලව වුනත් මේ ගිවිසුම කොමසාරිස් තුමාට යැවීමේදී එතුමා ඒක ප්‍රතික්ෂේප කරවි. එනිසා මං හිතන්නේ පොදු කටයුතු සඳහා තියෙන බිම් කඩවල් මින් ඉදිරියටවත් මොනම හේතුවක් නිසාවත් පුද්ගලික කටයුත්තකට හෝ කිසිම කාරණාවකට පොදු කටයුතු වලට හැර ලබා නොදීමට කටයුතු කරනවා නම් හොඳයි.එවැනි දෑ මේ සභාවට ඉදිරිපත් කිරීමෙන් වලකින්න කියලත් මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා. උප සභාපතිතුමා කීවා වගේ අපි දැඩි අපහසුතාවයට ලක්වනවා එහිදි.අපි මහජන ජන්දයෙන් පත්වෙලා මෙතනට එන්නේ ඔවුන්ගේ පොදු දේපල ආරක්ෂා කිරීමේ පොරොන්දුව මත.ඉතින් මෙහෙම වුනහම බරපතල ගැටලු නිර්මාණය වනවා.සභාවට මෙය ඉදිරිපත් කිරීමේදී නිළධාරීනුත් වාර්තා කරලා තිබුනේ නෑ මීට කලිනුත් මෙම බිම් කඩ ඉල්ලලා තිබුණා කියලා.එවැනි ආකාරයේ වාර්තාවක් ලැබුණ නම් තත්වය මීට වඩා වෙනස් වෙන්න ඉඩ තිබුණා.අපි නිළධාරින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා මින් ඉදිරියට සභාවේ දේපලක් අපහරණය කිරීමකදි හෝ බදු ගිවිසුම් වලට යාමේදී ඒ සම්බන්ධ ගොනු වල ඇත්ත ඇති සැටියෙන්ම වාර්තා කරන්න කියලා.එනිසා අපි මේ අවසරය ලබා දුන් පක්ෂය වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කරනවා.ඔවුන්ට පොදු අවශ්‍යතා සඳහා නොවන වෙනත් බිම් කඩක් දෙන්න පුලුවන්නම් අපි ඒ ගැන විරුද්ධ වන්නෑ .අනෙක් නිවැසියන් සඳහන් කරන්නේ ඔවුන් මරණයකදි මගුලකදි වෙනයම් අවශ්‍යතා වලදී ප්‍රයෝජනයට ගත්තේ මේ බිම් කඩය කියලා. එනිසා මේ බිම් කඩ තිබු ආකාරයෙන් පොදු කටයුතු සඳහා තබන්න කියලා ඉල්ලා සිටිනවා.

- **පෙ. ව. 10.00 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්නියගේ මහතා සහ බී.ජනිත් වික්‍රමතිලක මහතා සභාවට පැමිණෙන ලදි.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. හාෂිනී මේනුකා විජේසූරිය මහත්මිය කතා කරමින්</u>**

ගියවර සභා වාරයේදි චින්තක මහත්මයා කළ ඉල්ලීමට මමත් නැගී සිට කීවා සභාවට බදු මුදලක් අයවන නිසා මෙය ලබා දෙන්න කියලා. නමුත් ඒ වන විට අනෙක් ගෙවල් නවයෙන් විරෝධතාවයක් එල්ල වී තිබුණේ නෑ. එනිසා මෙය සලකා බලා සාධාරණයක් ඉටුකරන්න කියලා ඉල්ලනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

ඇත්තටම ඒ සිද්ධිය සම්බන්ධයෙන් කනගාටු වනවා.මොකද අපි සභාවෙ ගත්ත තීරණයක් ඉතා කෙටි කලකින් වෙනස් කිරීමට වීම ගැන සහ ගරු සභාව හා මන්ත්‍රීවරුන් අපහසුතාවයට පත්වීමට වීම සම්බන්ධයෙන්.ඒ වගේම අපි මේ වරප්‍රසාදය ලබාදුන් පාර්ශවය වෙනුවෙනුත්.මෙහිදී බාහිරට විද්‍යමාන වෙන්නේ සභාවේ බංකොලොත්භාවයක් සහ තීරණ කළමනාකරනයේ අඩුපාඩුවක්.කෙසේ වුනත් අපේ තීරණ අපිම හැල්ලුවට ලක්කර ගැනීමක් වෙලා තියෙන්නේඅපේ සභාව පැත්තෙන් සලකා බැලීමේදි මේ ඉල්ලීම් කරුවන්ගේ ලිපිය සභාවේ න්‍යාය පත්‍රයට ඇතුලත් වුන් නෑ. සභාපතිතුමණි මම නොදැනුවත්ව මෙය න්‍යාය පත්‍රයේ තිබුණද දන්නෑ. සභාපතිතුමණි මෙය න්‍යාය පත්‍රයේ ඇතුලත් කර තිබුණද?

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වෙනත් කරුණු යටතේ ඉදිරිපත් කරලා තිබුනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

වෙනත් කරුණු යටතේ ඉදිරිපත් කිරීමත් ප්‍රමාණවත්.නමුත් එයට ප්‍රමුඛතාවයක් ලබා දෙන්න තිබුණා. කෙසේ නමුත් පොදු දේපලක් සම්බන්ධයෙන් සභාව පරිපාලනමය වශයෙන් අගතියකට හෝ අසාධාරණයකට පත්වෙලා නම් අපි ගත්ත තීරණ වෙනස්කිරීමට හැකියාවක් තියෙනවද කියලා අපේ කොමසාරිස්තුමාගෙනුත් විමසා බලන්න කියලා ඉල්ලා සිටිමින් දෙපාර්ශවයටම ඇහුන්කන් දීලා දෙපාර්ශවයටම සාධාරණයක් ඉටුවන ආකාරයට, ගරු මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා කීව ආකාරයට මෙතනින් ඉවත් කිරීමක් කරන්න වෙනවනම් අපට ඒ පාර්ශවයට වෙනත් ස්ථානයක් දෙනන පුලුවන්නම්....

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කාටවත් දීලා නෑ. මන්ත්‍රීතුමන්ලා දන්නවා මෙතන හිස් භූමියක් තියෙන්නේ. ඉවත් කිරීමක අවශ්‍යතාවයක් නෑ කවුරුත් නැති නිසා.හිස් භූමියක් ඉල්ලලා තිබුනේ ව්‍යාපාරයක් කරගෙන යන්න කියලා. ඒ අවස්ථාවේදි ආදායම් නිළධාරි වාර්තා කරලා තිබුණා මේක රු.1100.00 කට දීම සුදුසුයි කියලා. එදා ඉදිරිපත් කළ කරුණු මත ගත්ත තීන්දුවක් සභාවේ තියෙන්නේ. මෙතනදි ඒක දීම සම්බන්ධයෙන් තවත් පාර්ශවයක් අගතියට පත්වෙලා තියෙනවා.එතකොට අපි දෙපාර්ශවය ගැනම සලකා බැලීමක් කරන්න ඕන.එතකොට අපි ගත්ත තීන්දුව එදාට සාපේක්ෂව හරි.අද වෙනත් විරෝධතාවයක් තියෙනවනම් අපි දෙපැත්තටම සවන් දීලා හරි තීරණයකට එන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

මමත් පැහැදිලි කළේ දෙපාර්ශවයටම සවන් දීලා අවස්ථාණුකූලව සාධාරණත්වය ඉටුකරලා අපේ පොදු දේපලක් සම්බන්ධයෙන් තියෙන නීති රෙගුලාසි මත අගතියට පත් පාර්ශවය සම්බන්ධයෙන් ඒ තියෙන දේවල් ප්‍රකෘතිමත් තත්වයට පත් කිරීම සම්බන්ධයෙන් සාධාරණ තීරණයක් සභාව හැටියට ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

ඇත්ත වශයෙන්ම අසල්වැසියෙක් විදියට ඉන්නෙ මම. ඇත්ත වශයෙන්ම තමුන්නාන්සේ මේ දේවල් න්‍යාය පත්‍රයට දාලා අපට එවන්න ඕන.එතන අඩුවක් වෙලා තියෙනවා. නමුන්නාන්සේ මේක ලිපි ඉදිරිපත් කිරීම යටතේ තමයි ගත්තෙ.ලිපි ශීර්ෂ යටතේ අරගෙන ඔබතුමා ආදායම් නිළධාරීගේ වාර්තාව කියවලා මේක රු.1100.00 කට දෙන්න කියලා තීරණය කළා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා මම තීරණය කළේ නෑ. සභාව තීරණය කළේ.මම සභාව කියන දේ ක්‍රියාත්මක කළා.අනෙත් එක මම ඒ වෙලාවේ විශේෂයෙන්ම ඇහුවා ළගම ඉන්න පුද්ගලයා විදියට ජයන්න මන්ත්‍රීතුමා මේ ගැන මොකද කියන්නේ කියලා.ඕක දෙන්න කීවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

තමුන්නාන්සේ දැනටම ඔහොම තමයි කියන්නේ.මට එතනට තමයි එන්න ඕන වුනේ. තමුන්නාන්සේ කියලා තියෙනවා ජයන්න මන්ත්‍රීතුමා තමයි මේක දෙන්න කීවේ කියලා මේ ලියුම දෙන්න ආව අයට. ඉතින් ඇත්ත වශයෙන්ම අපි වචනයක්වත් කතා නොකර මෙතන ඉන්නේ තමුන්නාන්සේ අපි කතා නොකෙරුව දේත් කතා කළා කියලා ප්‍රකාශ කරනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ මන්ත්‍රීවරු සියලු දෙනාම සාක්ෂි දරනවා  තමුන්නාන්සේ දෙන්න කියලා කීවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

මම කීවේ මේක සමුපකාරයට ඉල්ලලා තිබුණා කියලා විතරයි.එච්චරයි මං කතා කළේ. දෙන්නයි කියලා කතාවක් මම කීවේ නෑ එහෙම නම් ඒවා වාර්තා වෙන්න ඕනනේ.භාෂිනි මහත්මිය තමයි නැගිටලා කීවේ මේක දීම සම්බන්ධව අපි සලකලා බලලා මේක දෙන්න කියලා.එච්චරයි කතා කළේ මේ සම්බන්ධව.අනෙක් සේරම වාඩි වෙලා හිටියේ. මමත් වාඩි වෙලා හිටියේ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වාර්තා කරපු එක භාෂිණි මන්ත්‍රීතුමිය නැගිටලා කීවා. ඔබතුමා වාඩි වෙලා කීවා. වාඩි වෙලා කියපු නිසා වාර්තා වෙන්නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

තමුන්නාන්සේට ඕන දෙයක් කියන්න පුලුවන්. දැන් අද මම නැගිටලා ප්‍රකාශයක් කරනවා. ඒදා මෙතන ඉඩම් කච්චේරි එකක් තිබ්බා එතනදි පටබැදිමුල්ලේ ඉඩම් තුනක් දෙන එකේ ඔබතුමා කියලා තියෙනවා ජයන්න මන්ත්‍රීතුමා අකමැති වුණා නැතිනම් මේක කලින් දෙන්න තිබුනා කියලා. මං මේ ඉඩම් දෙනකොට කීවේ මේ සම්බන්ධ ඉඩම් කමිටුවක් තියෙනවා.ඒ කමිටුවට දාලා මේ ඉඩම් දෙන්න ඕන කියලා.විරුද්ධත්වයක් කීවේ නෑ. මේ වාර්තාවේ තියෙනවා. එදත් තමුන්නාන්සේ කියලා තියෙනවා ජයන්ත මහත්තයා තමයි මේකට විරුද්ධ වුනේ කියලා. ඇත්තටම මෙතන වචනයක් කතා කරන්න බැරි තමුන්නාන්සේ මේවා කණපිට පෙරලලා මාව වට්ටන්න කටයුතු කරනවා. ඒක හින්දා තමයි මම අදහස් ප්‍රකාශ කරන්නැත්තෙ....අපට දෙවන සැරේටත් එවනවා න්‍යාය පත්‍රයට අමතර කාරණා.ඒ කරුණු යටතේ හරි මෙහෙම ඉල්ලීමක් තියෙනවා කියලා දන්වන්න තිබුණා. එතකොට 12 දෙනාම දන්නවා මෙහෙම දෙයක් තියෙනවා කියලා මෙතෙන්ට එනකොට. තමුන්නාන්සේ ඉදිරිපත් කරලා තිබුණ ලියුම කියවුවා කාර්මික නිළධාරියාගේ නිර්දේශය කියවුවා ඒකේ තියෙනවා රු.1100.00 කට දෙන්න කියලා. ඒක තමයි සත්‍ය සිද්ධිය.මම ඇත්ත වශයෙන්ම මේ දෙපාර්ශවයේ අයම දන්නවා.සමුපකාරයට දෙද්දි ඒකට තැනක් නැති නිසා මම ඒකෙදි හිටියා. නැතෙයි කියන්නෑ මම ඒක. ඇත්තවශයෙන්ම ගෙවල් නවයෙම අයට මේ ස්ථානය අවශ්‍යයි.අද කාර් එකක් ආවත් නවත්තන්න තැනක් නෑ. පාරේ නවත්තන්නත් බෑ. මෙතන ඉඩකඩ තියෙනවා. ඒක නිසා මම කෙටියෙන්ම කියනවා මේක තියෙන ආකාරයටම තියන්න.තව මම විශේෂයෙන්ම ඉල්ලනවා බදු ඉල්ලීම ඉඩම් ඉල්ලීම් වලදි ලිපි ශීර්ෂ යටතේ ඉදිරිපත් කරන්න එපා. ඒක ලේකම් මහත්තයට දාලා න්‍යාය පත්‍රයට ඇතුලත් කරලා එවන්න කියලා. පුටු කොඩි ඉල්ලනවා වගේ පොඩි දෙයක් නෙවෙයි මේක. එතනයි වැරදුන තැන.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

තව මන්ත්‍රීවරුන්ගේ අදහස් තියෙනවද? විපක්ෂ මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරන්න. විරෝධතාවයක් නැති නිසා ඒකමතිකව සම්මත වෙනවා. ඒ අනුව ගියවර සභාවේ 12.21  යටතේ ගත්ත තීන්දුව අවලංගු කරනවා. නමුත් මම මෙහිදි විශේෂයෙන්ම කියන්න ඕන මේකට මගේ පුද්ගලික උනන්දුවක් තිබ්බේ නෑ. මම වටේ ඉන්න මේ මන්ත්‍රීවරුන්ට කියලා විපක්ෂ නායකතුමාගෙන් ඇහුවා අනෙක් අයට අගතියක් වෙනවද කියලා. නෑ දෙන්න කීවා. මම විශේෂයෙන්ම ඇහුවා

මොකද මිට කලින් සභා වාරයකදි තිබ්ච්ච පරිපාලන යෝජනා ප්‍රතික්ෂේප කරන්නයි මේකට අනෙක් පැත්තට කටයුතු කරන්නයි ආකාර දෙකකින් හැසිරෙනවා කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

ඉඩම් දෙනවනම් ඒ නීතියට අනුව දෙන්න ඕන. තමුන්නාන්සේට හොද නරක පෙන්නලා දෙන්න බැනේ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හොද නරක මම තේරුම් ගන්නවා. මගේ විශේෂ උනන්දුවක් නෑ මේක සම්බන්ධව.මම ඇහුවා මේක ළග ඉන්න මන්ත්‍රිවරුන්ගෙන් අදහස මොකක්ද කියලා. මොකද මිට කලින් ඉඩම් දීපු ඒවා සම්බන්ධ අත්දැකීම් අපට තියෙනවා.

**තීරණය**

☞ **නගර සභා නිවාස සංකීර්ණයේ පදිංචි එච්. එන් නානායක්කාර, කේ. ලංකාද සිල්වා ,එස්. ප්‍රේමවති, පී.පී. කරුණාවති,එල්. සෝමාද සිල්වා, ඩබ්.පී. උපුල් සානජී,ගමගේ යසසිරි යන අය විසින් නගර සභා නිවාස සංකීර්ණය ඉදිරියෙහි පිහිටා ඇති ලොට් අංක 12,පර්චස් 4.37 ක භූමි ප්‍රමාණය ටී.ඩබ්. විරන්ත යන අයට බදු ක්‍රමය යටතේ ලබා දීමට විරෝධතාවය ප්‍රකාශ කර තිබූ බැවින් මෙම ඉඩම් කොටස තිබෙන පරිදිම තබන ලෙස ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඒ අනුව 2014.07.01 දින පැවති මාසික සභාවේ තිරණ අංක 12: 21 යටතේ ගන්නා ලද සභා තීරණය අවලංගු කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ **නැත**

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා **නැත**

**5:1** **ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා:** **නැත**

**5:2** **නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා** :

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පසු ගිය සභාවේ නිළධාරින්ගේ පරිපාලන යෝජනා **5:2** මේ සභාවට කල් තිබ්බා. ඒ කල් තියපු යෝජනාවේ නිවාස කම්ටුවේ තීන්දුව පරිදි එම යෝජනාව නැවත ඉදිරිපත් කරනවා.

**05:02:01** 2014.07.17 දින පවත්වන ලද නිවාස කම්ටුවේ නිර්දේශය පරිදි පහත විස්තර කරනු ලබන ඉඩම දකුණු පළාතේ , ගාල්ල දිස්ත්‍රිjක්කයේ වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ ප්‍රාqදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 85 පටබැදිමුල්ල ග්‍රාැම නිලධාරි වසමේ පිහිටි බලයලත් මිනින්දෝරු

ඩී.ජී.මෙන්ඩිස් මහතා විසින් 2006/11/23 දින මැන පිළියෙල කරන ලද අංක 7118 දරණ පිඹුරේ නිරූපිත,

ඉහත කී අම්බලන්ගොඩ පටබැදිමුල්ල ගමේ පිහිටි ලුණුහැර තොට බඩේවත්ත නමැති ඉඩමේ කැබලි අංක ඒ දරණ ඉඩම් කැබැල්ල නම් වූ ,

උතුරට : ඩී.සිරිසේනගේ ඉඩම

නැගෙනහිරට :මුහුදු වෙරළ පාර

දකුණට : සෝමවතී මෙන්ඩිස්ගේ ඉඩම

බස්නාහිරට : ජේ.ඩබ්.අනුර ගේ ඉඩම

යන,

මායිම් තුල පිහිටි පර්.07.5 ක් වන ඉඩම් කැබැල්ල ජර දීප් අජන්ත ඇලෙක්සැන්ඩර් විතාන යන අයට පවරා දීමට යෝජනා කරමි.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පසුගිය වාරයේ මේ සම්බන්ධයෙන් නිවාස කමිටුව පරික්ෂණ පවත්වලා ඒක ඒ අයට දෙන්න කියලා තීන්දු කළා.

<u>**තීරණය**</u>

☞ **ඉහතින් සඳහන් කරන ලද බිම් කැබැල්ල ප්‍රදීප් අජන්ත ඇලෙක්සැන්ඩර් විතාන යන අයට පවරා දීමට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05:02:02** 2014.07.17 දින පවත්වන ලද නිවාස කමිටුවේ නිර්දේශය පරිදි පහත විස්තර කරනු ලබන ඉඩම දකුණු පළාතේ , ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 85 පටබැදිමුල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බර්ටි ඒ ද සිල්වා මහතා විසින් 1979/12/01 දින මැන පිළියෙල කරන ලද අංක 67 5 දරණ පිඹුරේ නිරූපිත,

ඉහත කී අම්බලන්ගොඩ පටබැදිමුල්ල ගමේ පිහිටි දූනුහැරතොට බණ්ඩාර වත්ත නමැති ඉඩමේ කැබලි අංක 13 දරණ ඉඩම් කැබැල්ල නම් වූ ,

උතුරට : පාර

නැගෙනහිරට :මුහුදු වෙරළ පාර

දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස

බස්නාහිරට : මෙම ඉඩමේ 13A දරණ කැබැල්ල

යන,

මායිම් තුල පිහිටි පර්.08.20 ක් වන ඉඩම් කැබැල්ල ඩී.බී.සිරිසේන යන අයට පවරා දීමට යෝජනා කරමි.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ සම්බන්ධයෙනුත් නිවාස කමිටුවේ තීන්දුව ලැබිලා තියෙනවා.

<u>**තීරණය**</u>

☞ **ඉහතින් සඳහන් කරන ලද ඉඩම් කැබැල්ල ඩී. බී. සිරිසේන යන අයට පවරා දීමට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**05:02:03** 2014.07.17 දින පවත්වන ලද නිවාස කමිටුවේ නිර්දේශය පරිදි පහත විස්තර කරනු ලබන ඉඩම දකුණු පළාතේ , ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 85පටබැදිමුල්ල ග්‍රාමය නිලධාරි වසමේ පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බර්ටි ඒ ද සිල්වා මහතා විසින් 1979/12/01 දින මැන පිළියෙල කරන ලද අංක 677 දරණ පිඹුරේ නිරූපිත,

ඉහත කී අම්බලන්ගොඩ පටබැදිමුල්ල ගමේ පිහිටි මාතරගෙවත්ත නමැති ඉඩමේ කැබලි අංක 07 A දරණ ඉඩම් කැබැල්ල නම් වූ ,

උතුරට : සුසාන භූමි පාර
නැගෙනහිරට :මෙම ඉඩමේ කැබලි අංක 7 සහ පාර
දකුණට : පුද්ගලික ඉඩම්
බස්නාහිරට : - එම -

යන,

මායිම් තුල පිහිටි පර්.09.0 ක් වන ඉඩම් කැබැල්ල නන්දන දිසානායක යන අයට පවරා දීමට යෝජනා කරමි.

<u>**තීරණය**</u>

☞ **ඉහතින් සඳහන් කරන ලද ඉඩම් කැබැල්ල නන්දන දිසානායක යන අයට පවරා දීමට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

☞ 05:02:04 යෝජනාව සංශෝදනය කර ඊලඟ සභා වාරය සඳහා ඉදිරිපත් කිරීමට සභාව තීරණය කරන ලදී.

**(06)** කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2014- 07- 22** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා මුලාසනය දැරූ 2014/07/22 දින පුස්තකාල කමිටු වාර්තාව.</u>**

| | |
|---|---|
| ■ ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | (ගරු නගර සභා මන්ත්‍රී) |
| ■ ඩී.වී. වාසනා තරංගි මිය | (ප්‍රජා සංවර්ධන නිලධාරි) |
| ■ කේ.ඩබ්. රංජනී මානෙල් මෙනවිය | (පුස්තකාලයාධිපතිනි) |
| ■ ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා | (කමිටු සාමාජික) |
| ■ සිරිපාල මාදුවගේ මහතා | (කමිටු සාමාජික) |
| ■ හර්බට් වීරක්කොඩි මහතා | (කමිටු සාමාජික) |
| ■ පී.ඩබ්. ගුණසිරි මහතා | (කමිටු සාමාජික) |
| ■ ආර්.පී. අමරසිංහ මිය | (උපගුරු දේවානන්ද විද්‍යාලය) |
| ■ ආර්.ඒ. ගිෂානි මල්ෂා මිය | (උපගුරු ප්‍රජාපති බාලිකා විද්‍යාලය) |
| ■ පී.එච්.එල්. පියන්ති මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මහතා | (පුස්තකාල සාහායක) |
| ■ ඒ.පී. රසිකා මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ගෞරි වර්සවිතාන මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ එස්. සුසිලා දීපානි මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ඒ.පී. ලක්ෂ්මී පෙරේරා මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ■ මාලතී සමන්තා ආරියසිංහ මිය | (පුස්තකාල සාහායිකා) |

ගරු සභාපතිතුමා කමිටුවට පැමිණි මහත්ම මහත්මීන් පිළිගැනීමෙන් පසු එදින ප.ව 2.30ට සභාවේ වැඩ ආරම්භ කළේය

■ **පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදුවිය.**

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපතිනිය විසින් ඉදිරිපත් කරන ලදි. පොල්වත්ත ශාඛාව හා හිරේවත්ත ශාඛාවේ සේවය කරන සහයිකාවන් දෙදෙනාම අසනීප බැවි ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මහතා ප්‍රකාශ කළේය. එම නිසා එම ශාඛාවල වාර්තා ඒ මහතා විසින් ඉදිරිපත් කරන ලදි. අනෙකුත් ශාඛා පුස්තකාලවල

ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරීන් විසින් ද, විද්‍යුත් පුස්තකාලයේ වාර්තාව ප්‍රධාන පුස්තකාලයේ සේවය කරන පියන්ති මෙනවිය විසින් ද, ඉදිරිපත් කරන ලදි.

ශාඛා පුස්තකාලවල ප්‍රස්තාරය අනුව පොත් පරිහරණය කරන පාඨක පිරිස අඩුබවත් ඒවායේ සාමාජිකයින් සියය දක්වා වැඩි කරගතයුතු බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කළේය. කමිටුවට සහභාගිවීමට නොහැකි බැවි දන්වා කමිටු සාමාජික සුගත් හෙට්ටිආරච්චි මහතා එවන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් කමිටුවට ඉදිරිපත් කරන ලදි.

■ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් මිලදී ගත් උසස් පෙළ විෂය ධාරාවට අවශ්‍ය පොත් ද, ගුරු අත්පොත්වල නම් හා මිල පුස්තකාලයාධිපතිනිය ඉදිරිපත් කළාය. ගරු සභාපතිතුමා විසින් පාඨක අදහස් පොත් නිරීක්ෂණය කිරීමෙන් පසු එම පොත් ලබාදීම ගැන ස්තූතිකොට සිසුන් සඳහන්කර ඇති බව ප්‍රකාශ කළේය.

■ විවෘත විශ්ව විද්‍යාලයේ මූලික පරිගණක පුහුනුව සඳහා පුස්තකාල සාහායිකාවන් කීප දෙනෙකුට සභාවෙන් මුදල් වැයකොට එම පුහුනුව ලබාදීමට කටයුතු කළ ද, ප්‍රායෝගික පුහුනුව සඳහා ඔවුන් නොපැමිණි බවත් එහි ගොස් විදුහල්පතිතුමා හමුවී එය සම්පූර්ණ කරන ලෙස සභාපතිතුමා ඉල්ලීමක් කළේය. විවෘත විශ්ව විද්‍යාලයේ විදුහල්පතිතුමා ඒ බැව් දැනුම් දුන් බවත් වැඩි දුරටත් පැවසුවේය.

■ ඕකන්ද, හෙප්පුමුල්ල ශාඛාවලට වඩා හිරේවත්ත ශාඛාවේ සාමාජික සංඛ්‍යාව අඩු බවත් පොත් ප්‍රමාණය වැඩි බවත් කමිටු සාමාජික ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා පෙන්වා දෙන ලදි. එම ශාඛා පුස්තකාල දෙක දියුණු කරගත යුතු බවද එම මහතා පෙන්වා දුන්නේය.

■ එම්.ඩබ්.කේ. සිල්වා මහතා විසින් පරිත්‍යාග කරන ලද පොත් සඳහා ස්තූතිය පළකර ලිපියක් යවන ලෙසත් එම පොත්වල නම් කමිටුවට ඉදිරිපත් කරන ලෙසද ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට ගරු සභාපතිතුමා පැවසුවේය.

■ පෝරඹ ශාඛා පුස්තකාලයේ පාඨක පිරිස මව්බිම පුවත්පත ඉල්ලා ඇතිබවද, පාඨක අදහස් පොත් බැලීමෙන් පසු සභාපතිතුමා පැවසුවේය. ඉතා අඩුවෙන් පරිහරණය කරන ලද පුවත්පතක් නවත්වා එම පුවත්පත ගැනීම සුදුසු බව කමිටු නිලධාරි මහතුන්ගේ තීරණය විය. ප්‍රධාන පුස්තකාලයේ ද එම පුවත්පත නොමැති බවද, පුස්තකාලයාධිපතිනිය ප්‍රකාශ කළාය.

■ වෙනත් කරුණු :-

■ ජාතික කියවීම් මාසයේ උත්සවය ගැන ගරු සභාපතිතුමා ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියගෙන් විමසන ලදි. සැප්තැම්බර් මස තරග පවත්වන බවද, උත්සවය ඔක්තෝම්බර් මස පවත්වන බවද ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය කමිටුව දැනුවත් කළාය. බැංකු වලින් අනුග්‍රාහය දක්වන බවත් උත්සවය සඳහා වැයවන ඇස්තමේන්තුව ගැන ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය කමිටුවට පැවසීය.

■ කෙරමිණිය ශාඛා පුස්තකාලයේ නාම පුවරුව අළුත්වැඩියා නොකිරීම ගැන ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා පැවසීය. ස්ටිකර් මගින් නාම පුවරුව ඉතා සුළු වේලාවක අළුත්වැඩියා කිරීමට හැකිබව ගරු සභාපතිතුමා විසින් පැවසුවේය. එම කටයුතු ගැන සොයාබලා හැකි ඉක්මනට එම නාම පුවරුව අළුත්වැඩියා කිරීමට කටයුතු කරන ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය දැනුවත් කළාය.

■ මහනුවර ඩී.ඇස්. සේනානායක මධ්‍ය පුස්තකාලයේ කටයුතු පරිගණක ගත කිරීම සඳහා විවෘත විශ්ව විද්‍යාලයට ගෙවා ඇත්තේ ලක්ෂ දෙකක් පමණ මුදලක් යයි ද අපට ද ඒ අනුව විවෘත විශ්වවිද්‍යාලයෙන් එම කටයුතු කරගත හැකි යයි ද ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා පැවසුවේය.

■ වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින් ස්තුති කතාව සදහා ගරු සභාපතිතුමා විසින් ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතාට ආරාධනා කළේය. එහිදි එතුමා ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම මහත්ම මහත්මීන්ට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළේය.

**ඒ අනුව 2014 -07- 22 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2014- 07- 21** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනිපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව**
**2014.07.21 ප.ව. 2.30**

**සහභාගීත්වය**

- ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. — ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව.
- පී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
- බී ජනිත් වික්‍රමතිලක මහතා — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
- කේ. පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා. — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
- ග්‍රේෂන් කෙරමිණියගේ මහතා. — ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
- එස්.ඩබ්. භාෂිණී විජේසූරිය මහත්මිය. — ගරු නගර සභා මන්ත්‍රිනී, අම්බලන්ගොඩ නගර සභාව.
- භාරත සමරසේකර මහතා. — ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව
- වෛද්‍ය පී.ආර්.එන් ද සිල්වා මහත්මිය — සෞ.වෛ.නි.අම්බලන්ගොඩ
- එම්.පී.බී.ඩබ්.යූ කුමාරි මහත්මිය. — ආයුර්වේද වෛද නිලධාරිනී.අම්බලගන්ගොඩ නගර සභාව
- පී. එස්. එස්. ද සිල්වා මහතා. — ම. සෞ. පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව
- එච්.නයනා චාන්දනී.මහත්මිය — ප්‍රා. ලේ.කාර්යාලය, අම්බලන්ගොඩ.
- එම් මලිත් ප්‍රනාන්දු මහතා. — තාක්ෂණ සේවා නිලධාරි අම්බලන්ගොඩ නගර සභාව.
- පී. සී සජීවනී මහත්මිය. — තාක්ෂණ සේවා නිලධාරි අම්බලන්ගොඩ නගර සභාව
- ඩී. වාසනා තරංගි මහත්මිය. — ප්‍රජා සංවර්ධන නිලධාරි. අම්බලන්ගොඩ නගර සභාව.
- ඩී.එස්. ඊ ගමගේ මහත්මිය — ප.සෞ..සේ නිලධාරි අම්බලන්ගොඩ නගර සභාව.
- පී. එච්. එල්. සී. පුෂ්පරාණි මහත්මිය. — සං සහකාර, අම්බලන්ගොඩ නගර සභාව,
- ආර් සුසිලා නන්දනී මහත්මිය. — කළමණාකරණ සහකාර

**පිළිගැනීම.**

**ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා.**

සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනී ඇතුලු සියළු නිලධාරි මහත්ම මහත්මීන් හා අනෙකුත් සියලුම රජයේ නිලධාරිනුත්, නගර සභා කාර්ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදී.

**2014.06.18 දින පැවති රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනය**

| මාතෘකාව | **සාකච්ඡා වූ කරුණු** | **ප්‍රකාශය කවුරුන් විසින්ද යන වග** | **තීරණය** |
|---|---|---|---|
| කසල අවසන් බැහැරලන ස්ථානයට ප්‍රවේශ මාර්ගය පස් දමා සකස් කිරීම | මෙම මාර්ගය කොරිපස් යොදා සකස් කිරීම සඳහා ඇස්තමේන්තුව සකස් කර සභාවට යොමු කර ඇති අතර විස්කම් කොන්ක්‍රීට් වර්ක්ස් වෙත ගෙවිය යුතු බිල්පත් නොගෙවීම නිසා එම කාර්ය ඉටු කර නොහැකි වූ බව කසල අවසන් බැහැරලන භූමිය තුළ පස් තල්ලු කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රය ලබා ගැනීමට නොහැකි වී ඇති බව හා කඩිනමින් D 4 E යන්ත්‍රය කසල තුනී කිරීම සඳහා ලබා දෙන ලෙස | ම.සෞ.ප.පී.එස්.එස්. ද සිල්වා මහතා | |
| | ගිණුමට මුදල් වැටුණු විගස එම චෙක්පත ලියන ලෙස ගණකාධිකාරි මහතාට උපදෙස් දෙන ලදි. චෙක්පත ලබා දුන් පසු D 4 E යන්ත්‍රයේ සේවය ලබා ගෙන කසල තුනී කිරීමට කටයුතු කරන | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | |

| | | | |
|---|---|---|---|
| | ලෙසත්, භාවිතා කරන ලද D 4 E යන්ත්‍රයක් මිලදී ගැනීම වඩා ලාභදායී වනු ඇති බවත්, ඒ පිළිබඳව සොයා බලා වාර්තා කරන ලෙසත්, ම.සෞ.ප. මහතාට උපදෙස් දෙන ලදි. | | |
| නගරයේ එකතුවන කසල දැමීම සඳහා ස්ථාන කිහිපයක ට්‍රේලර තැබීම | ට්‍රේලර් දෙකක තීන්ත ආලේප කර වැඩ අවසන් කර ඇතත් රිම් හා ටයර් නොලැබුණු බව. | තාක්ෂණ සේවා නිලධාරි පී.සී සජීවනී මිය. | |
| සෞඛ්‍ය අංශයේ සේවකයන් සඳහා රේන් කෝට් ලබා දීම | සියලුම අවශ්‍ය විස්තර හා ප්‍රමාණයන් ලිඛිතව ලබා දී ඇත. මෙතෙක් රේන් කෝට් නොලැබුණු බව හා තත්වයෙන් උසස් රේන් කෝට් ලබා දෙන ලෙසත්, ආර්පිකෝ රේන් කෝට් තත්වයෙන් හොඳ බවත්. | ම.සෞ.ප. පී.එස්.එස්. ද සිල්වා මහතා | |
| | රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගන්නේ නම් මිල ගණන් කැඳවීම අවශ්‍ය නොවන බව | තාක්ෂණ සේවා නිලධාරි මලිත් ප්‍රනාන්දු මහතා. | |
| | ආර්පිකෝ රේන් කෝට් තත්වයෙන් හොඳ නම් මිල ගණන් කැඳවීමකින් තොරව ලබා ගැනීමට උපදෙස් දෙන ලදි. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | |
| පුංචි පොළ නිසා ඒ අවට ප්‍රදේශය දැඩි සේ අපිරිසිදු වීම | මෙම ගැටළුව මේ වන විට විසඳී ඇති නමුත් ඊට වඩා විශාල කසල ගොඩක් පිටුපස පවතින බවත් ඒ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය පියවර ගන්නා ලෙස ම.සෞ.ප. සංජීව මහතාට උපදෙස් දෙන ලදි. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා. | |
| කන්ද මාවත ලොන්ඩරිය තුලින් පිටවන අපද්‍රව්‍ය පිළිබඳ ගැටලුව | එම ස්ථානය පරික්ෂා කළ බවත්, ලොන්ඩරිය පිටුපස තාප්පයෙන් ජලය කාන්දු වන බව දක්නට ලැබුණු බව | ම.සෞ.ප. පී.එස්.එස්. ද සිල්වා මහතා | |
| | ආයුර්වේද ගාඩින් ආයතනය දැනුවත් කර අපද්‍රව්‍ය උරා ගැනීමේ වලක් ආයතනය තුළම සකස් කර එහි මෙම කාර්ය ඉටු කිරීම වඩාත් සුදුසු බවත් බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති තුමන් විසින් නාමල් ඇලේ ජලය කළු පැහැවී ඇති බවට ලිපියක් එවා තිබූ බවත් මෙවැනි ගැටළු වක් නිසා එබන්දක් සිදුවනවාද යන්න සොයා බලන ලෙස ම.සෞ.ප.මහතාට උපදෙස් දෙන ලදි. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහත | |
| | කසල තේ නිෂ්පාදනය මෙම ප්‍රදේශයේ සිදුවන බැවින් නාමල් ඇලේ ජලය කළු පැහැ වීම මේ හේතුව නිසා සිදුවනවාද යන්න සැක සහිත බව | ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | |
| හෙප්පුමුල්ල ප්‍රදේශයේ එකම නිවසේ ඩෙංගු රෝගීන් තුන්දෙනකු සිටින බව | හෙප්පුමුල්ල ප්‍රදේශයේ එකම නිවසේ ඩෙංගු රෝගීන් තුන්දෙනකු සිටින බව | ගරු නගර සභා මන්ත්‍රී, කේ. පුෂ්පික ඉන්ද්‍රජිත් මහතා. | |
| | නාමල් ඇලේ ජලය අපිරිසිදු වීම සම්බන්ධව සෙඩ් එක අසල සිට නාමල් ඇල දිගේ සමීක්ෂණයක් පවත්වා සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සුදුසු බව, | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහත | හෙප්පුමුල්ල ප්‍රදේශයේ ධූමායන කටයුතු සිද කිරීම හා කාණු පිරිසිදු කිරීම |
| වෙනත් කරුණු | | | |
| කාර්ය මණ්ඩල සඳහා සෞඛ්‍ය සායනයක් පැවැත්වීම | සායනය සඳහා අගෝස්තු 12 දින ලබා දී ඇති බවත්, දන්ත රසායනාගාර බස්රථය හා ජංගම රසායනාගාර බස්රථය පැමිණෙන බවත්, රුධිර පරීක්ෂණ සඳහා අවශ්‍ය බෙහෙත් මිලදී ගැනීමට සිදුවන බව | වෛද්‍ය පී.ආර්.එන් ද සිල්වා මහත්මිය | |
| | වෛද්‍ය සායනය සඳහා රු.15000.00ක ඇස්තමේන්තුව සකස් කර ඇති බව. | ආර්.සුසිලා නන්දනී මිය | |
| සෞඛ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් අඩු | සෞඛ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් අඩුවීම නිසා සේවකයන් පැමිණීමේ අඩුවක් පවතින බව | ම.සෞ.ප. පී.එස්.එස්. ද සිල්වා | |

| | | | |
|---|---|---|---|
| වීම නිසා සේවකයන් පැමිණීමේ අඩුවක් පවතින බව | | මහතා | |
| | ස්ථිර සේවකයන් කලින් නිවාඩු අනුමත කර නොමැති අවස්ථාවලදී වැටුප් රහිත නිවාඩු ලෙස සටහන් කිරීමෙන් මෙම ප්‍රශ්නය විසදෙනු ඇත. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | |
| තල්ගස්ගොඩ ප්‍රදේශයේ වංගුව අසල අනතුරු සිදුවීම | තල්ගස්ගොඩ ප්‍රදේශයේ වංගුව අසල පාරේ විශාල ලෙස කැලේ වැවී ඇති බැවින් අනතුරු සිදුවීම සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවට යොමු කළ ද විසදුමක් නොමැති බව | ගරු නගර සභා මන්ත්‍රී ජනිත් වික්‍රමතිලක මහතා. | |
| | මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මේ පිළිබඳ දැනුම් දෙන්න | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහත | |
| හල්වතුර ඇලවල් සියල්ලම වල් බිහි වී ඇති බව | හල්වතුර ඇලවල් සියල්ලම වල් බිහි වී ඇති බව හා හීන් ඇල හා දුම්රිය පොල අසල ඇති කුඩා ඇල මාර්ග පිරිසිදු කළ යුතු බව. | ගරු නගර සභා මන්ත්‍රී ජනිත් වික්‍රමතිලක මහතා | |
| | පාරුව අලුත්වැඩියා කර ඇලවල් පිරිසිදු කිරිම සඳහා යොදවන්න | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | |
| | ආයුර්වේදය භාවිතා කරන රෝගීන්ගේ පැමිණීම හොඳ බව.අවශ්‍ය බෙහෙත් ලැබෙන්නේ නම් වඩාත් පහසු වන බව. | ආයුර්වේද වෛද්‍ය නිලධාරී එම්.පී.බී.ඩබ්.යූ කුමාරි මහත්මිය | |
| | ආයුර්වේද සංස්ථාවෙන් ලැබෙන බෙහෙත්වලට අමතරව බෙහෙත් අවශ්‍ය වන්නේ නම් ඒ පිළිබඳ දැනුම් දුනහොත් එම බෙහෙත් ලබා දිය හැකි බව ගර්භණී මව්වරුන් සඳහා පාරම්පරික ක්‍රමවේදයන්ට අනුකූල වූ උපදෙස් ලබා දීමේ වැඩපිළිවෙලක් ආරම්භ කිරීමට හැකි බව. | ගරු සභාපති ඇම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා | |
| ස්තූති කතාව | අද දින රැස්වීම සඳහා පැමිණි සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තූතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදී. | නගර සභ මන්ත්‍රී පී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා. | |
| නිමාව | ප.ව.4.30 | | |

සකස් කළේ :
පී.එච්.එල්.සී.පුෂ්පරාණි.
සංවර්ධන සහකාර (පරිසර)

**<u>ගරු නගර සභා මන්ත්‍රී බි. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

මෙහිදී මම සෞඛ්‍ය කමිටුවේදී ඉදිරිපත් කල කාරණය සම්බන්දයෙන් පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි සභාපතිතුමණි.මෙහි තල්ගස්ගොඩ ප්‍රදේශයේ වංගුව අසල අනතුරු සිදුවීම යන කාරණය යටතේ එතන වැරදි සඳහන් කරලා තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බි. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

ඒකේ මම සඳහන් කළේ තල්ගස්ගොඩ ප්‍රදේශයේ වංගුව අසල පාරේ විශාල ලෙස කැලේ වැවී ඇති බැවින් අනතුරු සිදුවීම සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවට යොමු කළ ද විසදුමක් නොමැති බව නෙවෙයි .
තල්ගස්ගොඩ ප්‍රදේශයේ වංගුව අසල පාරේ විශාල ලෙස කැලේ වැවී ඇති බැවින් අනතුරු සිදුවීම සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවට යෝජනාවක් ලෙස යොමු කර විසදුමක් ලබා ගන්නා ලෙසයි.ඒ අනුව එය සංශෝධනය විය යුතුයි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සම්බන්ධීකරණ කමිටුවට යොමු කර විසදුමක් ලබාගන්නා ලෙස ඒක සංශෝධනය කරන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

තිලකපුර පොලිස් මුරපෙළේ ස්ථානාධිපති තුමා මට ඇවිල්ලා කිව්වා මෙම ස්ථානයේ විශාල අනතුරු සංඛ්‍යාවක් සිදුවන බව. වටිනා ජීවිත ප්‍රමාණයක් අහිමි වුණා අම්බලන්ගොඩ ප්‍රදේශයේ. කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී වරයා විශාල රිය අනතුරකට ලක්වුණා. ඒ වගේම මගෙත් ජීවිතය බේරුණා වාහනය සම්පූර්ණයෙන්ම විනාශ වුණා. එතුමා මට ඇවිල්ලා කිව්වා අපි හරි මුලික වෙලා මේක කපමු කියලා.ඒ අනුව මම අපේ නගර සභා සේවකයෙක් නිවාඩු දිනයක කර්මාන්ත අධිකාරිතුමාගෙන් ඉල්ලගෙන ඒ ගියපු වියදම් සේරම මම දරලා අපේ නගර සභා සිමාව තුළ සම්පූර්ණයෙන්ම දෙපැත්ත කපාලා ඉවර කරලා තියෙන්නේ. අපි තීරණය කළා බටපොල ප්‍රදේශය දක්වා කපන්න. දෙපැත්තම අපි නගර සභා සීමාවේ තිලකපුර හන්දිය දක්වා සම්පූර්ණයෙන්ම කපලා තියෙන්නේ. විශේෂයෙන්ම කියන්න ඕන අපේ මාධ්‍යවේදීන් ගියා බලන්න.ඇත්තටම අපි ස්තුතිවන්ත වෙනවා තිලකපුර පොලිස් මුරපොලේ ස්තානාධිපති තුමාට. එතුමයි අපට මෙය පෙන්නලා දුන්නේ. මොකද මෙහි හැමදාට අනතුරු එකක් හෝ දෙකක් අනිවාර්යෙන්ම සිද්ද වුණා. සභාපතිතුමා මේ පාර මේ වනකම් මාර්ග සංවර්ධන අධිකාරියට භාරදීලා නෑ කොන්ත්‍රාත් සමාගම විසින්. මොකද මම දිගින් දිගටම කතා කළා. එතකොට එගොල්ලා පවසනවා අපි මේක සුද්ධ කලොත් අපිට විගණන විමසුමක් එනවා කියලා.එනිසා අපට මෙය සුද්ධ කරන්න මේ වනතුරු බෑ කියලා. මේ පාරේ වැඩ කොටස් ඉවර නැති නිසා  මාර්ග සංවර්ධන අධිකාරියෙන් භාරගන්නෑ. මෙය තමයි ගැටලුව. ඉතින් අපි දිගින් දිගටම මේ ගැටලුව විසදන්න ගියොත් තවත් අනතුරු වනවා. ඉතින් ඊට ඉස්සෙල්ලා අපි මැදිහත් වෙලා නගර සභා සීමාව තුළ මේ කටයුත්ත ඉෂ්ට කරලා ඉවරයි සභාපතිතුමණි.

**ගරු නගර සභා මන්ත්‍රී බි. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

මෙතුමා සදහන් කළ කාරණාව මම පොඩි පැහැදිලි කිරිමක් කරන්න ඕන. මේ අනතුරු සිද්ධ වීම තුළ තමයි අපට මේ ප්‍රශ්නය හොදටම පෙනුනේ. ඉතින් ඇත්තටම මේ තියෙන තත්වය උඩ බස් එක නැවත්තුවාම බහින්න වෙලා තියෙන්නේ කැලේට. ඇත්තටම මෙතුමා කිව්වා මේවන තුරුත් ඒ පාර මාර්ග සංවර්ධන අධිකාරියට භාර දීලා නෑ කියලා. එහෙමනම් ඒකේ අසම්පුර්ණ තත්වයක් තියෙනවා. මොකද ඒකේ සුදු ඉර ගහලා තියෙන ඉරෙන් මෙහා පැත්ත සම්පූර්නයෙන්ම කැලේ වැවෙන්නේ ඒක හොදට පස් දාලා තලලා නැති නිසා. එනිසා එය හොදට පස් දාලා තලන්න ඕන.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අද සම්බන්ධිකරණ කමිටුව හවසට තියෙනවා. ඔබතුමා ඒකෙදි ඉදිරිපත් කරන්න. ඒක දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සම්බන්දයෙන් සාකච්ජා කරන අවස්ථාවේ මේ කරුණ සම්බන්ධයෙන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන්න.අපේ උපසභාපතිතුමා ඇතුලු අපි කණ්ඩායම ඔබතුමාට සහය ලබා දෙනවා.

ඒ අනුව මෙම කමිටු වාර්තාවේ තල්ගස්ගොඩ ප්‍රදේශයේ  වංගුව අසල අනතුරු සිදුවීම යන කරුණ යටතේ ගරු නගර සභා මන්ත්‍රී බි. ජනිත් වික්‍රමතිලක මහතා කළ ප්‍රකාශය පහත පරිදි සංශෝදනය විය යුතුය.

තල්ගස්ගොඩ ප්‍රදේශයේ වංගුව අසල පාරේ විශාල ලෙස කැලේ වැවී ඇති බැවින් අනතුරු සිදුවීම සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවට යෝජනාවක් ලෙස යොමු කර විසදුමක් ලබා ගන්නා ලෙස....

**ඒ අනුව 2014 -07- 21 දින පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

**7:1 ටෙන්ඩර් හා මිළගණන් :-**

**7:1:1 ටෙන්ඩර් :- නැත**

**7:2 මිල ගණන් :-**

**7:2:1** D4E යන්ත්‍රයේ සේවය ලබා ගැනිම සඳහා මිල ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිලධාරී නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | විස්කම් කොන්ක්‍රීට් වර්කස් | ත්‍රිමා විතාන කොන්ක්‍රීට් වර්ක්ස් | උපාලි කොන්ක්‍රීට් වර්ක්ස් |
|---|---|---|---|---|---|
| 01 | D4E යන්ත්‍රයේ සේවය ලබා ගැනිම වෙනුවෙන් පැයකට ගාස්තුව | පැය 1 | 3250.00 | - | මිල ගණන් |
| 02 | PC 40 ස්කැවේටර් යන්ත්‍රය නොවට්සු | පැය1 | - | 1800.00 | ඉදිරිපත් නැත |

**7:2:2** ගබඩා භාණ්ඩ මිලදී ගැනිම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිලධාරී නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **Fire force engineering** | **Safety systems(PTE)** | **SL fire safety systems** |
|---|---|---|---|---|---|
| 01 | 09 Liter water type fire extingnisher | 05 | 4200.00 | 4650.00 | 4400.00 |
| 02 | 02 KG carbon dioxide fire extingnisher | 07 | 4800.00 | 5300.00 | 5100.00 |
| 03 | 09 KG Dry powder type fire extingnisher | 04 | 5100.00 | 5500.00 | 6000.00 |

**7:2:3** කෝලාස් මිලදී ගැනිම සඳහා මිල ගණන් කැඳවන ලද අතර තාක්ෂණ සේවා නිලධාරී නිර්දේශය ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනිමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ලංකෙම් සිලෝන් ලිමිටඩ් | බිටුමිකස් පුද්ගලික සමාගම | සෙනොක් ට්‍රේඩ් කම්බයින් | ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියර් |
|---|---|---|---|---|---|---|
| 01 | Collas Barralls (CSS-1) 200Ltrs (Vat සහිත මිල) | | 22175.00 | 20160.00 | 19600.00 | මිල ගණන් ඉදිරිපත් නැත |

**(08)** ගෙවීම්

8.1 ඇ. අංක 1026 යටතේ කැබ් රථයේ අලුත්වැඩියා කිරීමට ලබා ගත් පවර් ස්ටියරින් බොක්ස් එකක් ලබා ගැනිම වෙනුවෙන් ගාල්ල ජයන්ත ඉලෙක්ට්‍රිකල්ස් ඇන්ඩ් ඔටෝ ඉංජිනියරින් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 48000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8.2 ඇ. අංක 1031 යටතේ ලබා ගත් විදුලි උපකරණ සඳහා අම්බලන්ගොඩ, චානක එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 81350.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8.3 ඇ. අංක 1037/1038/1039/1040 යටතේ ට්‍රේලර් 2 ක් අලුතින් සකස් කිරීම සඳහා වාහන උපාංග මිලදී ගැනීම වෙනුවෙන් කොළඹ අරලිය ස්ටීල් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 385850.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8.4 ඇ. අංක 1041 යටතේ ලබා ගත් 750 X 16 සියටි වර්ගයේ ටයර් 05 ක් හා 600 X 14 සියටි වර්ගයේ ටයර් 02 මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ, සුමිත් මාර්කටින් පුද්ගලික සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 101939.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8.5 ඇ. අංක 1045 යටතේ ලබා ගත් ලිපිද්‍රව්‍ය වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 47725.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

| | | |
|---|---|---|
| Letter Heads 50 X 225.00 | = | 11250.00 |
| File covers 500 X 11.50 | = | 5750.00 |
| Special Letter Heads 25 X 675.00 | = | 16875.00 |
| 9’’ X 4’’ Envelops 5000 X 2.20 | = | 11000.00 |
| 6’’ X 31/2’’ Envelops 3000 X 0.95 | = | 2850.00 |
| | | 47725.00 |

8.6 ඇ. අංක 1053 යටතේ ලබා ගත් L.P Gas සිලින්ඩර් 8 ක් සඳහා අම්බලන්ගොඩ මිලිඳු එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57744.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

ගෑස් සිලින්ඩර් 08 - 8 X 7218.00 = 57744.00

8.7 ඇ. අංක 1055 යටතේ ලබා ගත් න. ස. 03 පරිගණක ආකෘති 5000 ක් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 59000.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

( 5000 X 11.80 = 59000.00 )

8.8 ඇ. අංක 1057 යටතේ ලබා ගත් කෝලාස් බැරල් 10 ක් වෙනුවෙන් කොළඹ 02 ලංකෙම් සිලෝන් පීඑල්සී වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 207200.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

| | | |
|---|---|---|
| කෝලාස් බැරල් 10 X 18500.00 | = | 185000.00 |
| VAT | = | 22200.00 |
| | | 207200.00 |

8.9 ඇ. අංක 1058 යටතේ ලබා ගත් පරිගණක ප්‍රින්ටර් 04 ක් වෙනුවෙන් අම්බලන්ගොඩ ඔමැක් ටෙක්නොලොජි ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 29000.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

( 4 X 7250.00 = 29000.00 )

8.10 ඇ. අංක 1060 යටතේ ලබා ගත් CFL බල්බ් 200 ක් සඳහා අම්බලන්ගොඩ චානක එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 100000.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

CFL බල්බ් 200 X 500.00 = 100000.00

8.11 ඇ. අංක 1061 යටතේ ඡායා පිටපත් යන්ත්‍රයට ලබා ගත් Canon IR 2318 L වර්ගයේ ටෝනර් 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් මාතර මෙට්‍රොපොලිටන් ඔෆිස් පුද්ගලික සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 14448.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

| | | |
|---|---|---|
| ටෝනර් 3 X 4300.00 | = | 12900.00 |
| VAT 12 % | = | 1548.00 |
| | | 14448.00 |

8.12 ඇ. අංක 1063 යටතේ ලබා ගත් L.P Gas සිලින්ඩර් 8 ක් සඳහා අම්බලන්ගොඩ මිළිඳු එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57744.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

ගෑස් සිලින්ඩර් 8 X 7218.00 = 57744.00

8.13 ඇ. අංක 1064 යටතේ ලබා ගත් කාර්යාල ලිබඩු උපකරණ වෙනුවෙන් අම්බලන්ගොඩ පත්මා ෆර්නිචර් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 58100.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

| | | |
|---|---|---|
| ලාච්චු 4 චානේ කබඩ් 4 X 11200.00 | = | 44800.00 |
| ලියන මේස 1 X 8400.00 | = | 8400.00 |
| ලියන මේස පුටු 1 X 4900.00 | = | 4900.00 |
| | | 58100.00 |

8.14 ඇ. අංක 1069 යටතේ ලබා ගත් සිමෙන්ති කොට්ට 30 ක් සඳහා බටපොල බී. බී. හාඩ්වෙයාර් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 26700.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

සිමෙන්ති කොට්ට 30 X 890.00 = 26700.00

8.15 ඇ. අංක 1073 යටතේ ලබා ගත් 90 Amp Exid බැටරියක් මිලදී ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ ආර්. පී. ඇල්ෆ්‍රඩ් ද සිල්වා කම්පැනි වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 16307.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8.16 ඇ. අංක 1074 යටතේ ලබා ගත් L.P Gas සිලින්ඩර් 8 ක් සඳහා අම්බලන්ගොඩ මිළිඳු එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57744.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

ගෑස් සිලින්ඩර් 8 X 7218.00 = 57744.00

8.17 කා. නි. අංක 0340 හා 0339 අනුව 20' X 20' වේදිකාව, ශබ්ද විකාශන යන්ත්‍ර සහ විදුලි ආලෝකය ලබා ගැනීම වෙනුවෙන් අම්බලන්ගොඩ පෝරඹ උපේන්ද්‍ර එගොඩගේ මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 90000.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8.18 නගර සභා රැස්වීම් ශාලාවේ වායු සමීකරණ යන්ත්‍රය අලුත් වැඩියා කිරීම වෙනුවෙන් අම්බලන්ගොඩ පටබැඳිමුල්ල රන්ජන් ප්‍රනාන්දු මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 14500.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8.19 කාර්යාලීය පරිගණක අලුත් වැඩියා කිරීම වෙනුවෙන් රු. 22800.00 ක් ද Windows 7 ඇතුලත් කිරීම වෙනුවෙන් රු. 1500.00 ක් ද වශයෙන් මුලු මුදල රු. 24300.00 ක මුදලක් අම්බලන්ගොඩ එල් එස් ජේ කම්පියුටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 24300.00 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:20 .re iNdm;s;=ud" Wm iNdm;s;=ud we;=,q k.r iNd uka;%Sjrekaf.a 2014 uehsa udih i|yd .uka úhoï oSukdj fjkqfjkaa re' 18000.00 l uqo,la f,alïf.a ks¾foaYh mßos f.ùug iNdfõ wkque;sh ලබාදෙන ලදී.

8:21 k.r iNdj u.ska md,kh jk mqia;ld, i|yd 2014 cqks udihg imhk ,o mqj;am;a fjkqfjka re' 41355.00 l uqo,la f,alïf.a ks¾foaYh mßos tï' tia' ùrisxy uy;d fj; f.ùug iNdfõ wkque;sh ලබාදෙන ලදී.

8:22 2014-II ld¾;=j i|yd uqoaor nÿ jYfhka re' 32679.48 l uqo,la f,alïf.a ks¾foaYh mßos foaYSh wdodhï flduidßia ckrd,a fj; f.ùug iNdfõ wkque;sh ලබාදෙන ලදී.

8:23 2014-II ld¾;=j i|yd jeÜ nÿ jYfhka re' 230415.48 l uqo,la f,alïf.a ks¾foaYh mßos foaYSh wdodhï flduidßia ckrd,a fj; f.ùug iNdfõ wkque;sh ලබාදෙන ලදී.

8:24 2014 uehs ui VAT uqo,a wdmiq f.ùu fjkqfjka re' 50000/- l uqo,la f,alïf.a ks¾foaYh mßos foaYSh wdodhï flduidßia ckrd,a fj; f.ùug iNdfõ wkque;sh ලබාදෙන ලදී.

8:25 නගර සභා ක්‍රීඩාංගණය වෙන් කිරීම වෙනුවෙන් re' 7500/- ක මුදලක් කේ. මංජුල ප්‍රියන්ත මහතා වෙත නැවත ගෙවීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:26 නගර සභා ක්‍රීඩාංගණය වෙන් කිරීම වෙනුවෙන් re' 1000/- ක මුදලක් ගා/ දේවානන්ද විද්‍යාලය වෙත නැවත ගෙවීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්**

8.14 සිමෙන්ති බී.බී හාඩ්වෙයාර් වලින් අරන් තියෙන්නේ මොකද? මිල අඩුයිද ඒකේ ?

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මෙහෙට වඩා ලොකු මුදලක් අඩුයි. එහෙන් ගෙනාවේ විශේෂයෙන්ම මෙහෙන් ගන්න බැරි වුණා. ගෙවල් තුනකට යන්න බැරි පාරවල් වල වැඩක් තිබුණා සභාපතිතුමණි කරන්නට. එකෙදි මෙහේ වෙලදපොලේ සිමෙන්ති මිල අධිකයි. ඒ වගේම මුදල් ගෙවීමක් කරන්න කීවා ඔවුන් මුදල් වලටය දෙන්නේ කියලා. ඊට පස්සේ මම බටපොලට කතා කරලා අම්බලන්ගොඩට වඩා ලොකු මුදලක් අඩුවෙන් මං හිතන්නේ රු. 910.00 එක රු. 870.00 ට වගේ අරගෙන තමයි සභාපතිතුමණි වැඩේ කලේ.කොටේෂන් කැදවලා ගත්තේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පිලිතුර ප්‍රමාණවත්ද?

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

කොටේෂන් කැදවලා ගත්තනම් එහි ගැටලුවක් නෑ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා ඉතිරිපත් කරන්න කියන්න කොටේෂන්

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කොටේෂන් ඉදිරිපත් කරන්න අවශ්‍යද

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්**

අවශ්‍ය නෑ කොටේෂන් කැදවලා නම් ගත්තේ ගැටලුවක් නෑ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

8.26 බලන්න.මේක නැවත ගෙවීම ශ්‍රී දේවානන්ද විද්‍යාලය කිවම පොඩි ගැටලුවක් තියෙනවා. සභා තීන්දුව පරිදි තමයි මේ 1000.00 අයකරගෙන තියෙන්නෙ.නගර ශාලාව 2014. 03.026, 27, 28 දින වල ප්‍රාථමික මලල ක්‍රීඩා උත්සවය සඳහා දේවානන්ද විද්‍යාලය මගින් නගර සභාව වෙන්කර තිබුණි. ඒ සඳහා ගෙවූ මුදල රු. 3000.00 යි. නමුත් 2014.03.26 වන දින ගරු ජනාධිපතිතුමා පැමිණෙන බැවින් මැතිවරණ රැස්වීමක් පැවැත්වීම සඳහා ක්‍රීඩා පිටිය වෙන් කිරීමට අවශ්‍ය බව දැනුම් දීමෙන් ඔවුන් එම දින තුන අවලංගු කරන ලදී.ඒ අනුව ඉතිරි මුදල 1000.00 යි. ඒක ගෙවන්න තමයි අනුමැතිය ඉල්ලන්නේ. ඒ කියන්නේ දේවානන්ද විද්‍යාලයේ හේතුවක් මත නෙවෙයි ජනාධිපතිතුමාගේ පැමිණීම නිසාවෙන් අවලංගු කළ නිසා ගෙවන්න වෙනවා. ඒ අනුව එය නැවත ගෙවන්න සභාව තිරණය කරනවා.

8:27 විදුහුත් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන re' 90147.28 ක මුදලක් වැඩ අධිකාරීගේ හා ලේකම්ගේ නිර්දේශය පරිදි බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:28 විදුහුත් පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ (අතිරේක) කර්මාන්තයේ රැඳවුම් මුදල වන re' 684.10 ක මුදලක් වැඩ අධිකාරීගේ හා ලේකම්ගේ නිර්දේශය පරිදි බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:29 අම්බලන්ගොඩ කරිත්තකන්ද මාර්ගය - 1 පටුමග (අදියර 1) කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන re' 48476.67 ක මුදලක් වැඩ අධිකාරීගේ හා ලේකම්ගේ නිර්දේශය පරිදි තල්ගස්ගොඩ සුදුවැල්ල කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:30 පින්නදූව පොදු නාන ළිඳ අලුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ 10% රැඳවුම් මුදල වන re' 5788.03 ක මුදලක් වැඩ අධිකාරීගේ හා ලේකම්ගේ නිර්දේශය පරිදි කෙරමිණිය කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:31 2014 අප්‍රේල් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 I | 38962.27 |
| 23453 I | 2398.88 |
| 34453 I | 3523.88 |
| 52453 I | 37555.65 |
| 53454 | 16777.60 |
| 62453 I | 21888.62 |
| | 121106.90 |

විදුලි බිල්පත් සඳහා රු. **121106.90** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:32 2014 අප්‍රේල් මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 52453 II | 35132.30 |
| 62453 II | 26365.40 |
| 34453 II | 1040.48 |
| 23453 II | 16566.20 |
| 11453 II | 10480.96 |

**<u>89585.34</u>**

ජල බිල්පත් සඳහා රු: **89585.34** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:33 2014 මැයි මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවීම.

| <u>වැය අංකය</u> | <u>සැප්තැම්බර්</u> |
|---|---|
| 11452 | 27436.21 |
| 12452 | 1211.73 |
| 25451 II | 1476.23 |
| 62452 I | <u>4956.74</u> |
| | **<u>35080.91</u>** |

දුරකතන බිල්පත සඳහා රු **35080.91** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:34 තල්ගස්ගොඩ ප්‍රධාන පාරේ වරි. අංක 27A අසළින් ඇති හරස් පාර කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ රුදවුම් මුදල වන re' 49986.27 ක මුදලක් වැඩ අධිකාරීගේ හා ලේකම්ගේ නිර්දේශය පරිදි තල්ගස්ගොඩ සුදුවැල්ල කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:35 හල්වතුර ක්‍රීඩාංගනය හා කාණු පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තයේ පළමු කොටස් ගෙවීම් මුදල වන රු.127844.40 ක මුදලක් වැඩ අධිකාරීගේ හා ලේකම්ගේ නිර්දේශය පරිදි අංක 83 කරිත්තකන්ද ප්‍රජා මණ්ඩලය සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

8:36 නගර සභාවට අයත් 252-0730 දරණ කැබ් රථයේ ගියර් පද්ධතියේ අලුත්වැඩියාව සඳහා උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු. 63178.80 ක මුදලක් වැඩ අධිකාරීගේ හා ලේකම්ගේ නිර්දේශය පරිදි බලයලත් අලවි හා සේවා නියෝජිත යුනයිටඩ් මෝටර්ස් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

- **පෙ. ව. 10.30 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා සිල්වා මෙනවිය සභාවට පැමිණෙන ලදී.**

8:37 නගර සභා පෙර පාසල් නිල ඇඳුම් මැසීම සඳහා එක් ඇඳුමකට රුපියල් 200.00 බැගින් ඇඳුම් 182 මැසීම වෙනුවෙන් රු.36400.00 ක මුදලක් අම්බලන්ගොඩ තල්ගස්ගොඩ පී. එච්. ප්‍රියංකා චාන්දනී මිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාවේ අවසරය තයෙනවනම් 8.37 කියලා මුදල් ගෙවීමක් තියෙනවා . නගර සභා පෙර පාසල් නිල ඇදුම් මැසීම සඳහා ඉදිරිපත් කරන ලද අවම මිල ගණන් යටතේ එක් ඇදුමකට රු.200.00 බැගින් ඇදුම් 182 ක් මැසීම වෙනුවෙන් අම්බලන්ගොඩ පී. එච්. ප්‍රියංකා චාන්දනී මිය වෙත රු.36400.00 ක මුදලක් ගෙවීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

8:38 කාර්යාලයීය පරිගණක අලුත්වැඩියා කිරීම සහ පරිගණක සඳහා වින්ඩෝස් 07 මෘදුකාංගය ඇතුලත් කිරීම වෙනුවෙන් රු.24300.00 ක මුදලක් අම්බලන්ගොඩ LSJ කම්පියුටර් සෙන්ටර් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අනුමත කරනවා. 8.38 ගෙවීම. මේවා කලින් තිබුණ ඒවනේ . මේවා ඇත්තටම න්‍යාය පත්‍රයට යන්න ඕන. න්‍යාය පත්‍රයට දෙන්න ඕන යෝජනා ඒ විදියට දෙන්න. අන්තිම දවසේ දීලා මේක මන්ත්‍රීවරු භාරගන්නම් කීවොත් ඉදිරිපත්කරන්නම්. භාරගන්න බෑ කීවොත් ලබන සභාවට තමයි ඉදිරිපත් කරන්න වෙන්නේ. එනිසා ගෙවීම් හරියට න්‍යාය පත්‍රයට දාලා කරන්න.
කාර්යාලයීය පරිගණක අලුත්වැඩියා කිරීම සහ පරිගණක සඳහා වින්ඩෝස් 07 මෘදුකාංගය ඇතුලත් කිරීම වෙනුවෙන් අම්බලන්ගොඩ LSJ කම්පියුටර් සෙන්ටර් වෙත රු.24300.00 ක මුදලක් ගෙවීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමණි අපි හිතුවේ එකයි කියලා

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දෙකයි. මට කිසි ප්‍රශ්නයක් නෑ ලබන සභාවට දාන්න පුලුවන්. මේක ගන්නවට මන්ත්‍රීවරු විරුද්ධද?විරෝධතාවයක් තියෙනවනම් අපි ලබන සභාවට දානවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

හල්වතුර ක්‍රීඩාංගනය හා කාණු පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තයේ පළමු කොටස් ගෙවීම් මුදල වන ....8.35 හේ වර්තමාන තත්වය තාක්ෂණ සේවා නිළධාරි අපට ඉදිරිපත් කරනවා නම් හොදයි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ ගෙවීමක්නේ දාලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ඔව් සභාපතිතුමා ඒකේ වර්තමාන තත්වය. මොකද මේක ගෙවීම කරන්නේ කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ සමිතිය ඇවිල්ලා මට කිවා ඒක ඇතුලේ වතුර තියෙනවලු. මොනම විදියකටවත් පස් දාලා තලන්න බෑලු. ඒක නිසා වතුර අයින් කරන්න ක්‍රමයක් හදන්න කියලා. ඉතින් ඒක අපේ වගකීමක්නේ. එතනින් වතුර බහින්න බටයක් හරි දාලා පාර කඩලා හල්වතුර ඇලට දාන්න. වතුර එකතුවෙන්න එතන වලක් කපලා හරියන්නැනේ. එපාර වෙන වෙන ප්‍රශ්න. ඩෙංගු වගේ. එනිසා වඩා හොදයි එතැන පාර කඩලා හියුම් පයිප්පයක් දාලා වතුර අයින් වෙන්න ඒ වගේ වැඩ පිළිවෙලක් කරන්න. ඒ වතුර ටික එලියට ගන්න අරගෙන ඇළටම දාන්න . ඒකට අවශ්‍ය ඇස්තමේන්තුවක් තියෙනවනම් දෙන්න . එතන කොහොම හරි විද්‍යාණුකුලව වතුර ටික ඇළට යන්න ඕන. එයාලා කියන්නේ කොච්චර පස් දැම්මත් වැඩක් නෑ එතන තලන්න විදියක් නෑ කියලා. මම දන්නෑ ඔවුන් කියන්නේ ඇත්තද කියලා මොකද මම බලන්නනම් ගියේ නෑ. ඇත්තටම එහෙම වැරදි. ඒවා නිත්‍යාණුකූල නොවන වැඩනේ. එපාර එතන ගිහින් කවුරු හරි පොඩි ළමයි එහෙම වැටිලා මැරුණොත්. නියම ආකාරයෙන් වැඩේ කෙරෙන්න අවශ්‍යනම් එතනින් හියුම් පයිප්පයක් දාලා වැඩේ කරන්න.

## (09 ගිණුම්

**9:1** 2014 ජුනි මාසය සඳහා වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2014 ජුනි මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

10:1 මහ අම්බලන්ගොඩ හරස් පාර කාණුව කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 253767.94 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:2 විද්‍යාල මාවත, පටබැඳිගෙදර දෙවට I කාණුව කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 34968.48 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:3 පටබැඳිමුල්ල කන්ද මාවත නගර සභා නිවාස වරි. අංක 18 ස්ථානයේ කාණුව කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 166807.25 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

10:3 ඇස්තමේන්තුව 166807.25 ක් ලෙස සංශෝදනය කර ඉදිරිපත් කරනවා.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:4 දුම්රියපොළ මංසන්ධියේ දෙමහල් සාප්පු සංකීර්ණයේ තින්ත ආලේප කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 290190.45 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමා ඒකේ තීන්ත ගානවා වගේම පිටිපස්සේ තියෙනවා වැසිකිළි වළක්. ඒ ගැනත් අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වැසිකිලිය කැඩිලා මියෝත් හාරලා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

කීප දෙනෙක්ම මාව එක්කන් ගිහින් පෙන්නුවා . තීන්ත ගානවා වගේම මේකත් මොකක් හරි කරලා දෙන්න. මං හිතන්නේ එතන කොන්ක්‍රිට් කිරීමක් කලානම් හොදයි. මොකද ඌරු මියෝ හාරලා තියෙන්නේ. කොනේම තියෙන සැලුන් එක පැත්තෙන් ගියානම් බලන්න තිබුණා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගිහින් බලන්න ඒක

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමා මම මේ සම්බන්ධයෙන් DSI ආයතනයේ කළමණාකාරතුමත් එක්ක කතා කළා ඔවුන්ගේ මුදලින් මේකේ තීන්ත ගාන්න අපි බස් නැවතුම්පළ කළා වගේ. මේ ආයතනයේ සභාපතුමාට දන්වන්න කීවා මෙපමණ මුදලක් යනවා කියලා.කළමණාකාරතුමාගෙන් අපට ලිපිනය ගන්න පුලුවන්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැනුම් දෙන්න

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

එහෙට දැනුම් දෙන්න නගර සභාවෙන් මේකට ප්‍රචාරන අනුග්‍රහයක් ලබා දෙන්න පුලුවන් කියලා. එනිසා මේක පින්තාරු කරන්න කැමතිනම් අනුග්‍රහය ලබා දෙන්න කියලා. ඔය ඇස්තමේන්තුව හරි වෙනත් ඇස්තමේන්තුවක් වුනත් කමක් නෑ. ඕකනම් අනිවාර්යෙන්ම අනුමත කරලා දේවි. රයිනෝ එකෙන් කළා වගේ සහපතිතුමණි මම කතා කරලා සතියක් විතර වෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි බස් නැවතුම්පළ කර අයගෙනුත් ඉල්ලීමක් කළා අපට අනුග්‍රහයකයෙක් හොයලා දෙන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

මේකේ DSI ආයතනයේ ප්‍රදර්ශනාගාරය තියෙනවනේ සභාපතිතුමා එනිසා එයාලා අනිවාර්යෙන්ම කරයි.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:5) ගාලු පාර මහජන ක්‍රීඩාගාරය අසල රථවාහන නැවතුම් භූමිය නවීකරණය කිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 1421304.80 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමණි මේක අපට ටිකක් පැහැදිලි කලානම් හොදයි. මොකද ලොකු මුදලක් වැය කරනවා මෙතනට. මොකක්ද මෙතන කරන්නේ , ඒ වගේම මෙතන නවතන වාහන වලින් නගර සභාවට මුදලක් අය කරනවද කියන එකත් මම දැන ගන්න කැමති.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නෑ අපි රට යාබදව ඉතාමත් අලංකාර වාහන නැවතුම් පළක් ඉදිකලා. ළමා ක්‍රීඩාංගනයට යාබදව. ඒ අනුව ඒ හා සමාන අලංකාරයක් එන විදියට කැට ගල් අල්ලා ග්‍රීන් නෙට් එකක් තියෙනවා පිට්ටනිය පැත්තෙන් ඒක කැඩිලා තියෙන්නේ. ග්‍රීන් නෙට් එක ගහලා ගස් වටේ බැම් බැදලා ලස්සනට හදන්න කියලා තමයි මේක කළේ. ඇස්තමේන්තුව එන්නේ වාහන නැවතුම්පළට වගේට කිසියම් අලංකාරයක් එන විදියට තමයි හදන්න බලාපොරෙත්තු වෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**</u>

මම අහන්නේ මේ නවත්තන වාහන වලින් මුදලක් නගර සභාවට අයවෙනවද කියලා. මොකද මෙයාලා ඇවිල්ලා වාහන නවත්තනවා. අපි මේවා හදලා දෙනවා.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

දැනට අපි මුදලක් අය කරන්නෑ

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**</u>

අපි දහ අට ලක්ෂයක් වියදම් කරනවා මෙතන අලංකාරයටත් එක්ක. වාහන ඇවිල්ලා නවත්තලා මෙතන සේරම කරගෙන යනවා. නමුත් නගර සභාවට කියක්වත් අය වෙන්නෑ. ඒ කියන්නේ ආදායමක් නෑ. ඒවා බලන්න ඕන වැඩ කරනකොට මොකක්ද අපට ලැබෙන ප්‍රතිලාභය කියලා. තමුන්නාන්සේ කියනවා වරිපනම් ගෙවන්නෑ බදු මුදල් නෑ කියලා. දැන් තියෙන බදු මුදල් ගෙවලා මේවා කරනකොට කට්ටිය ඇවිල්ලා නිකම්ම වාහනය ගහලා නිකම්ම යනවා. අපි මේ වගේ දේවල් වලදි සැලකිලිමත් වෙන්න ඕන නගර සභාවට ආදායමක් නැතිව ලක්ෂ දාහතරක් වියදම් කිරීමේ ප්‍රතිඵලය මොකක්ද කියලා. අපි එයාලට දෙන්න කියලා බැදිලා නෑ. මම හිතනවා එය ඔය විදියටම තියලා ක්‍රීඩා පිටියටම එක් කරනවානම් හොදයි කියලා.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නගර සභාව කියන්නේ ඇත්තටම ලාභ ලබනම ආයතනයක් නෙවෙයි ඇත්තටම. නගර සභාවේ වගකීම නැවතුම් ස්ථාන සැපයීම. නැවතුම් ස්ථාන සපයාගන්න බැරි අයගෙන් අය කරනවා. තමන්ගේ ඉඩම තුළ නැවතුම් පලක් හදාගන්න බැරි අයගෙන් ලක්ෂ එකහමාරක් අය කරනවා. ඉතින් අපි ඒ ගන්න මුදලට සමානුපාතිකව නැවතුම් පළවල් හදන්න ඕන. මට මතකයි තමුන්නාන්සේලාගේ පාලන කාලෙත් මේක අයකරලා තිබුණා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**</u>

අය කරගනිපුවා බැංකුවේ ඇති.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

බැංකුවේ නෑ. ඒවා සාමාන්‍ය ගිණුමට යන්නේ. ඒ ගිණුමට යන්නේ දඩ මුදල් විතරයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**</u>

සභාපතිතුමණි ඒ වාහන නැවතුම් සඳහා ටවුන් එකේ තියෙනවා . ටවුන් එකේ තමයි මේවා වැඩිපුර හැදිලා තියෙන්නේ.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

දැන් එතකොට මේක ටවුන් එකක් නෙවෙයිද?

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**</u>

මෙතන මිනිස්සු වාහනයක් ගහන්න එනවද.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ටවුන් එකේ තිබ්බ අවහිරයට ලක්වෙච්ච ලොරි ටික තමයි මෙතනට ගෙනාවේ.මේක වහලා මෙතන පිට්ටනියට එකතු කලොත් ලොරි ටික ගිහින් ගහව් ටවුන් එක මැද්දේ. එතකොට මිනිස්සුන්ට අපහසුතාවයක් ඒකෙන්වෙන්නේ. වැන් පාර්ක් එක තිබ්බා දුම්රිය පොල හන්දියේ. ඒක අපි ගෙනාවා වික්‍රමසූරිය පාරට. වික්‍රමසූරිය පාරේ තිබ්බ ලොරි ටික ගෙනාවා ක්‍රීඩාංගනය අසලට. අපි යම් යම් ආකාර වලින් මිනිස්සුන්ට තියෙන අවහිරතා අඩු කරගෙන අඩුකරගෙන තමයි මෙතනට ඇවිත් තියෙන්නේ. ලොරියක් ඕන කෙනෙක් අම්බලන්ගොඩ ක්‍රීඩාංගනය ගාවට ඇවිත් තමයි ඒක වෙන්කරවගන යන්නේ. මේක වහලා දැම්මොත් මේගොල්ලෝ යාවි වික්‍රමසූරිය පාරට. වැන් ටික යාවි හන්දියට. ඒපාර මිනිස්සුන්ට යන්න එන්නවත් ඉඩක් නැතිවෙයි. ඉතින් මේක ප්‍රයෝජනවත් දෙයක්. නගර සභාවෙ වගකීමක් වාහන් නැවතුම් ස්ථාන සපයන එක.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:6) 2014- 08- 12 දින සෞඛ්‍ය සායනයක් පැවැත්වීම සඳහා විෂය ලිපිරු විසින් සකස් කරන ලද රු. 15000/- ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේක තියන්නේ නගර සභා සේවකයින් සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සේවකයින් සඳහා සෞඛ්‍ය අමාත්‍යංශයෙන්. අවශ්‍ය බෙහෙත් අරන් දෙන්න සහ එන වෛද්‍යවරුන්ට ආහාර ලබාදෙන්න තමයි මේ මුදල .

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

දැන් මේ සභාව සඳහා සහභාගි වන නිළධාරින් සහ පිටස්තර පුද්ගලයින් සඳහා තේ එකක් ලබා දීමේ ක්‍රමවේදයක් සභාව සතුව නැද්ද?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාවට දැනුම් දිලා තියෙනවා සභා අරමුදලින් තේ ලබාදීම නීති විරෝධි කියලා. මම මේ සම්බන්ධයෙන් පිළිතුරක් සකස් කරලා තියෙන්නේ. සභාවට දැනුම් දෙන්න ඕන අපි සභාව විසින් තීරණයක් ගත්තා නගර සභා සේවකයින්ට උදේ සහ දහවල තේ ලබා දීමට. මේ තේ ලබා දීම නීති විරෝධි කියලා සභා අරමුදලින් එහෙම කරන්න බෑ කියලා දන්වලා තිබුණා. නමුත් මම අද දින මේ සම්බන්ධයෙන් පිළිතුරක් යවනවා පළාත් පාලන කොමසාරිස්තුමියට. සභාව විසින් මේ තේ සැපයීමෙන් අපේක්ෂා කළේ යම් කාර්යක්ෂම සේවාවක් සැපයීම. මොකද සේවකයෝ ටික තේ බොන්න කියලා උදේ 10 විතර බැහැලා ගියොත් එහෙම ආපහු එනකොට මෙතන විශාල තදබදයක් ඇතිවෙලා තියෙනවා. ආපසු හවසට 3.30 විතර තේ බොන්න ගියොත් එතනත්ත් ප්‍රශ්නයක් වෙනවා. මේ තීරණය ගත්තේ ඒකයි . එතකොට අපේ කිසිම නිළධාරියෙක් තේ බොන්න කඩේ ගියා කියලා ප්‍රශ්නයක් ඇතිවෙන් නෑ. අපි දැන්වුවා අපි මේ තීරණය ගත්තේ මහජනයාට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සපයන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

දැන් සභාපතිතුමා සවස 2 විතර පටන් ගන්න රැස්වීමක් සවස 5.30 විතර වෙනතම් තියෙනවා. ඕනම මනුස්සයෙක් තේ එකක් බොනවා.ඒක අත්‍යාවශ්‍ය දෙයක් මනුෂ ජීවිතේ. රැස්වීමක් මැද මනුෂයකුට පුලුවන්ද මං කඩේට ගිහින් තේ එකක් බිලා එන්නම් කියන්න. විශේෂයෙන්ම පිටින් එන අයට. සභාවේ ඉන්න අයට වෙනමම කාරණාවක් තියෙනවනේ.මේ සභාවට සේවයක් සපයන්න එන අයටවත් ඒක ලබාදීම සුදුසුයි කියලා මම හිතන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මම ඔබතුමා සමග සම්පූර්ණයෙන්ම එකග වෙනවා. මොකද සභාවට ලැබෙන අරමුදල් භාවිතා කිරීමේ බලය තියෙන්නේ සභා තීරණ මත. ඇත්තටම මේ කියන ආකාරයට අපි හිතමු නිළධාරින් 10 එනවා කොළඹ ඉදලා රාජකාරියකට. මේ කියන විදියට එතකොට තේ දෙන්න ඕන අපේ පෞද්ගලික සල්ලි වලින්. ඉතින් මේක ගැටලුකාරී තත්වයක්.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපට මේ සභාවේ ලැබෙන ආදායම මේ සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා ගන්න තිරණ අනුව ක්‍රියාත්මක කරන්න බැරි නම් මේ නගර සභා ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු පත්කරලා වැඩක් නැනේ සභාපතිතුමා. එහෙමනම් කොමසාරිස්තුමියට පුලුවන්නේ කවුරු හරි පත්කරලා මේක කරගන යන්න. එනිසා ගරු සභාපතිතුමණි අපි ඉල්ලා සිටිනවා අවුරුදු 4 සැරයක් ප්‍රජාතන්ත්‍රවාදී විදියට ජන්දයක් තියලා මේ ගරු සභාවට සභාපතිවරයෙක් උපසභාපතිවරයෙක් මන්ත්‍රීවරු ජනතා ජන්දයෙන් පත්කරලා වැඩක්නෑ. මොකද ඒ මන්ත්‍රීවරුන්ටත් ගරුත්වයක් තියෙන්න ඕන.කොමසාරිස්තුමියට දන්වා යවන්න එතුමියගේ මේ තිරණය අපි දැඩි සේ හෙළා දකිනවා කියලා. ගරු ප්‍රධාන අමැතිතුමත් සාධාරණයි කියලා අනුමත කරපුවා ආපසු එවනවා මේක නිති විරෝධි කියලා. මම යෝජනා කරනවා සභාපත්තුමනි මේ සම්බන්ධයෙන් ගරු පළාත් පාලන ප්‍රධාන අමැතිතුමන්ට දන්වා යවන ලෙස.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

පළාත් පාලන කොමසාරිස්තුම්ගේ නිර්දේශය ලිඛිතවම දන්වා ඒවා තියෙනවා . 01.නගර සභා සේවකයින් සඳහා සංග්‍රහ කටයුතු සඳහා සභා අරමුදලින් වියදම් දැරීම සුදුසු නොවන බව දැනටමත් මා විසින් පෙන්වා ඇති බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස නැවතත් දන්වා සිටිමි. 02. අම්බලන්ගොඩ නගර සභාවේ 2012 දිනට ණය හිමි ශේෂය කියලා දන්වලා එවලා තියෙනවා. ඒක වැරදි ඇත්තටම. මුදල් පොත අනුව බැලිමේදි බැංකු ගිණුම විටින් විට අයිරා තත්වයක් තිබියදී පොදු ගිණුම උත්සව කටයුතු සංග්‍රහ කටයුතු ත්‍යාග ලබා දීම ආදියට විශාල ලෙස මුදල් බැර කිරිම තුළ සභාව ඉදිරියේදී විශාල ලෙස මුදල් දුෂ්කරතා වලට ලක්විය හැකි බැවින් ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. 03. නගර සභාව මගින් උත්සව කටයුතු සඳහා නිල ඇදුම් ලබා දීම නිළධාරින්ගේ හා සේවකයින්ගේ විනෝද ගමන් සඳහා නගර සභා ආඥා පනත යටතේ මුදල් ලබා දීමට ප්‍රතිපාදන නොමැති බවද පෙන්වා දෙමි. රු. 20000.00 හෝ ඊට වැඩි අත්තිකාරම් ගෙවීම නිත්‍යානුකුල නොවන බව දැනටමත් මා විසින් දන්වා ඇති බැවින් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා තියෙනවා. ප්‍රදේශයේ දෙමාපිය සංගමයක් මගින් නගර සභාවේ නම භාවිතා කරමින් නගර සභාව නමින් ක්‍රිකට් ඇකඩමියක් ආරම්භ කර නගර සභා ක්‍රිකට් ඇකඩමිය නමින් මුදල් රැස් කිරිම බැංකු ගිණුම් පවත්වාගෙන යාම නිත්‍යානුකුල නොවන බැවින් එය නැවැත්තිමට ඉදිරි පියවර ගන්නා ලෙස දන්වමි. ඕවා තමයි දිලා තියෙන්නේ. මේක මම දකින්නේ පළාත් පාලන විෂය ගැන දැනුමක් නැතිව තමයි සහකාර කොමසාරිස්තුම්ය කටයුතු කරන්නේ. අද දකුණු පළාතේ ඉන්න ගාල්ල සහකාර කොමසාරිස්තුම්ය මේ විෂය ක්ෂෙත්‍රය ගැන අවබෝධයක් නෑ. මොකද නගර සභාවක් කියන්නේ ස්වාධින ආයතනයක්. ස්වාධීන ආයතනයකයි දෙපාර්තමේන්තුවකයි තියෙන බල තල දෙකක්. නගර සභාවට මහජනතාව විසින් මන්ත්‍රීවරු පත්කරලා එවන්නේ ඒ නගරයේ අයවන අයබදු මුදල් නිසි ලෙස මහජන කැමැත්ත අනුව කටයුතු කරන්න.

<u>**තිරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

- ❖ පෙ.ව. 10.55ට තේ පානය සඳහා සභාවේ කටයුතු විනාඩි 5 කට අත්හිටුවන ලදී.
- ❖ තේ පානයෙන් පසු පෙ.ව. 11.00 ට නැවත සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

10:7) නගර සභා මහජන ක්‍රීඩාංගනයේ විදුලි පහන් සවි කිරිම වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 588210.35 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තිරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

10:8) ඕකන්ද ජානකී රාජපක්ෂ මහත්මියගේ නිවස අසළ පැති බැම්මක් ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් තාක්ෂණ සේවා නිළධාරී විසින් සකස් කරන ලද රු. 243840.48 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(11)** වෙනත් කරුණු

**11:1** ' ස්තුතිය පල කිරීම - භාරත සිහල රිද්ම සංඛ 2014 ' මැයෙන් බන්දු විජේසූරිය කලායතනයේ අධ්‍යක්ෂිකා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

බන්දු විජේසූරිය කලායතනයේ කලා මංගල්‍ය මෙවරත් උත්කර්ෂවත් අන්දමින් පැවති බවත් එම උත්සවය මෙවරත් විනෝද බද්දෙන් නිදහස් කිරීම උදෙසා කටයුතු කිරීම පිළිබඳ ගරු සභාපති තුමන්ට හා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාට ගෞරවනීය ස්තුතිය පල කර තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**11:2** ' මාසික සභාවේ සංග්‍රහ කටයුතු සඳහා සත්‍ය වියදම් 2014 වර්ෂය ' මැයෙන් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

මාසික සභාවේ සංග්‍රහ කටයුතු සඳහා ජනවාරි මස 5110.00 ද පෙබරවාරි මස 5818.00 ද මාර්තු මස 5612.00 ද අප්‍රේල් මස 5774.00 ද මැයි මස 5902.00 ද ජුනි මස 5569.50 ද ජුලි මස 5797.00 ද වූ බව සඳහන් කර තිබූ අතර මෙම වියදම් අනුව සලකා බැලිමේදී මාසික සභාවේ සභා වියදම් සීමාව රු.5000.00 සිට රු.6000.00 දක්වා වැඩි කිරීමට සභාවේ අනුමැතියද ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ මාසික සභාවේ සභා වියදම් සීමාව රු.5000.00 සිට රු.6000.00 දක්වා වැඩි කිරීම සුදුසු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**(12)** න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** **'** රජයේ ආයතනයකින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම**'** මැයෙන් සැපයුම් නිළධාරිණී විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යංශය යටතේ ඇති ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ (විවිධ) නීතිගත සංස්ථාව රජයේ ආයතන සඳහා පහත සඳහන් භාණ්ඩ සපයන බව ලිපියක් මගින් දන්වා ඇති බවත් මෙම භාණ්ඩ හා සේවාවන් මාසයක් ඇතුලත ගෙවීමේ පදනම මත ණයට ලබා දෙන බව මෙම ආයතනයේ නිළධාරීන් විසින් වාචිකව ප්‍රකාශ කළ බවත් නගර සභාවට අවශ්‍ය උපරිම ණය සීමාව ලිපිය සමග ඒවා ඇති අයදුම් පතින් දන්වා එවන ලෙස දැනුම් දී ඇති බවත් මේ සම්බන්ධ අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

- ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ
- ටයර් ටියුබ් සහ එක්සයිඩ් බැටරි
- රසායන ද්‍රව්‍ය
- පරිගණක හා ඒ ආශ්‍රිත උපාංග
- ගෘහ භාණ්ඩ,ක්‍රීඩා භාණ්ඩ සහ යුනිලිවර් නිෂ්පාදන
- විද්‍යුත්, විදුලි භාණ්ඩ සහ ශබ්ද විකාශන උපකරණ
- කෘෂි උපකරණ
- යතුරු පැදි
- බලවේග යන්ත්‍ර සහ මෙවලම් අත් ආයුධ
- කාර්යාල සැලසුම් කරණය සහ කාර්යාල ඇතුලත ඉදිකිරීම්

<u>තීරණය</u>

☞ **ඉහතින් සඳහන් කරන ලද ද්‍රව්‍ය සෘජුවම ශ්‍රී ලංකා රාජ්‍ය වානිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් ලබා ගැනීමට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:2** **'** සභා වාහන සඳහා ඉන්ධන සැපයීමට ලබාගත් අත්තිකාරම් මුදල් වල වියදම් පිළිබඳ සාරාංශය **'** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

නගර සභාව සතු වාහන සඳහා ණය පදනම මත ඉන්ධන නිකුත් නොකිරීම නිසා ලබාගත් අත්තිකාරම් මුදල් වියදම් කළ ආකාරය හා පියවීම් සඳහා සභා අනුමැතිය ඉල්ලා තිබුණි.

2014-07-01 දින රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබාගත් බවත් ඉන්ධන සඳහා වියදම් වූ රු. 19961.00 ක මුදල පියවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත්, 2014-07-04 දින රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබාගත් බවත් ඉන්ධන සඳහා වියදම් වූ රු. 19964.30 ක මුදල පියවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත්, 2014-07-08 දින රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබාගත් බවත් ඉන්ධන සඳහා වියදම් වූ රු. 19731.00 ක මුදල පියවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත්, 2014-07-10 දින රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබාගත් බවත් ඉන්ධන සඳහා වියදම් වූ රු. 19990.70 ක මුදල පියවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත්, 2014-07-14 දින රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබාගත් බවත් ඉන්ධන සඳහා වියදම් වූ රු. 19946.20 ක මුදල පියවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත්, 2014-07-15 දින රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබාගත් බවත් ඉන්ධන සඳහා වියදම් වූ රු. 19981.50

ක මුදල පියවීමට අනුමැතිය ලබා දෙන ලෙසත් 2014-07-18 දින රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබාගත් බවත් ඉන්ධන සඳහා වියදම් වූ රු. 19981.50 ක මුදල පියවීමට අනුමැතිය ලබා දෙන ලෙසත් 2014-07-23 දින රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබාගත් බවත් ඉන්ධන සඳහා වියදම් වූ රු. 19910.90 ක මුදල පියවීමට අනුමැතිය ලබා දෙන ලෙසත් 2014-07-25 දින රු. 20000/- ක අත්තිකාරම් මුදලක් ලබාගත් බවත් ඉන්ධන සඳහා වියදම් වූ රු. 19981.50 ක මුදල පියවීමට අනුමැතිය ලබා දෙන ලෙසත් 2014-07-30 දින රු. 10000/- ක අත්තිකාරම් මුදලක් ලබාගත් බවත් ඉන්ධන සඳහා වියදම් වූ රු. 9930.20 ක මුදල පියවීමට අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඉන්ධන වියදම් සභාවට ඉදිරිපත් කරනවා 2014 ජුලි මාසේ. මන්ත්‍රීවරුන්ට මෙහි පිටපතක් අවශ්‍යද? මන්ත්‍රීවරුන්ට ඉන්ධන වියදම් හි පිටපතක් ලබා දීමට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ස්ථිර කරන ලදව විපක්ෂ නායකතුමාට පිටපතක් ලබා දීමට අවසර ලබා දෙන ලදි. අත්තිකාරම් මගින් ඉන්ධන ලබා ගැනිමේදි සඳහන් කරන්න ඕන , ගණකාධිකාරිතුමා සාමාන්‍යයෙන් වෙනදා සමුපකාරෙන් ගහද්දි ගිය වියදමයි මේකෙයි අතර අඩුවක් තියෙවනා නේද. ඒක මටත් ප්‍රශ්නයක් මොකද වුනේ කියන එක. තෙල් ගහන්නේ කොහෙන්ද දැන්.දැන් ඔයාට හිතෙනවද මොකක් හරි වංචාවක් වුනා කියලා.

**තීරණය**

☛ **ඉන්ධන වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් පියවීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.**

**12:3** ‘ නගර සභා නිළධාරීන්ගේ ක්‍රීඩා හා සුභ සාධක සංගමය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන විනෝද චාරිකාව - 2014 ’ මැයෙන් ක්‍රීඩා හා සුභ සාධක සංගමය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදි.

ක්‍රීඩා හා සුභ සාධක සංගමය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන විනෝද චාරිකාව 2014 සැප්තැම්බර් මස 05 , 06, 07, යන තෙදින තුළ යොදා ගැනිමට අදහස් කර ඇති බවත් එම චාරිකාව මෙවර නුවර එළිය හා සිගිරිය දඹුල්ල ආශ්‍රිත ස්ථාන නැරඹීමට අදහස් කරන බවත් මේ වෙනුවෙන් සභාව මගින් ලබා දෙන රු. 50000.00 ක මුදල ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි අනුමත කරන්නම් ගරු පළාත් පාලන ඇමතිතුමාගේ අනුමැතියට යටත්ව.

**තීරණය**

☛ ක්‍රීඩා හා සුභ සාධක සංගමයේ වාර්ෂික චාරිකාව සඳහා රු. 50000.00 ක මුදල ගරු දකුණු පළාත් පළාත් පාලන ඇමතිතුමාගේ අනුමැතියට යටත්ව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**12:4** **‘**නගර සභා වාහන අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි**’** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදි.

නගර සභාව සතු 53- 0529 අංක දරණ කැබ් රථයේ ටයිටින් බෙල්ට් එක යොදා එන්ජිම අලුත්වැඩියා කිරීමෙන් පසු මුදල් ගෙවීමට පෙර පළාත් පාලන දෙපාර්තුමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාවක් ලබා ගැනීමට තාක්ෂණ සේවා නිළධාරී නිර්දේශ කර අනුමත වී ඇති බවත් ඒ අනුව එම රථය 2014.07.21 දින රාජකාරී කටයුත්තක් සඳහා ගාල්ල නගරයට ගිය අවස්ථාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු මහතා හමුවු බවත් නමුදු ඒ මහතා කාර්යය බහුල බැවින් කැබ් රථය පරීක්ෂා කර ගැනීමට නොහැකි වු බවත් සභාව සතු වාහන අලුත්වැඩියා කටයුතු වලදී අවශ්‍ය පරීක්ෂා කිරීම් සඳහා සභාව මගින් යම් වැඩ පිළිවෙළක් සකස් කර ගන්නා ලෙස යාන්ත්‍රික ඉංජිනේරු මහතා වාචිකව උපදෙස් ලබා දුන් බවත් ඒ අනුව සුදුසු වැඩ පිළිවෙලක් සඳහා උපදෙස් ඉල්ලා තිබුණි.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ අනුව ඇත්තටම ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ඉංජිනේරු මගින් ලබාගෙන කටයුතු කිරීම සුදුසුයි කියලා ලබාගෙන තියෙනවා. ඇත්තටම ඉංජිනේරු මහත්මයා කියන්නේ මුලු පළාතටම එයා විතරලු යාන්ත්‍රික ඉංජිනේරු කෙනෙක්ට ඉන්නේ. ඉතින් හැම එකක්ම එතුමාට එවන්න එපා මේ ප්‍රදේශය ආශ්‍රිතව තියෙන යාන්ත්‍රනයක් හදාගන්න කියලා. ඉතින් අපට ළගම තියෙන තැන CTB එකේ ඉංජිනේරු මහතාගේ වාර්තාව. ඒ අනුව කටයුතු කරන්න සභාවේ අවසරය ලබාදෙනවා.

<u>තීරණය</u>

☛ සභාව සතු වාහන අලුත්වැඩියා කටයුතු වලදී අවශ්‍ය පරීක්ෂා කිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ අම්බලන්ගොඩ ශාකාවේ යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ උපදෙස් අනුව කටයුතු කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**12:5** ‘ එක් ගමකට එක් වැඩක් සංවර්ධන වැඩසයටහනක්- 2014 ’ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් එවා තිබූ වැඩ සටහන් ගොනුව සභාගත කරන ලදී.

එක් ගමකට එක් වැඩක් සංවර්ධන වැඩසටහනක් - 2014 වැඩ සටහන යටතේ තිලකපුර හෙප්පුමුල්ල තල්ගස්ගොඩ පටබැඳිමුල්ල පනියන්දුව කලුවඩුමුල්ල පෝරඹ ඕකන්ද මහ අම්බලන්ගොඩ විලේගොඩ හිරේවත්ත කරිත්තකන්ද පොල්වත්ත කෙරමිණිය යන ග්‍රාමසේවා වසම් වල විවිධ වැඩ සටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන සඳහන් කර තිබුණි.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් මෙවර ආර්ථික සංවර්ධන අමාත්‍යංශය මගින් ලැබෙන මුදල් , පසුගිය වාර වල මෙහෙට එවලා තමයි සංවර්ධන වැඩ සටහන් කළේ. නමුත් යම් විගණන ප්‍රශ්න මතුවෙලා තියෙනවා මොකද අපි යවන්නේ යම් කිසි සමිතියක් සමග අත්සන් කළ ගිවිසුමක් නිසා .එනිසා මෙවර පහත සඳහන් කාර්යයන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින්ම ඉටුකරවා ගැනීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා. මෙන්න මේවා තමයි මුදල් වශයෙන් ලැබිලා තියෙන. අම්බලන්ගොඩ බටපොල මාර්ගය තල්ගස්ගොඩ පිට්ටනිය දක්වා සුදුවැල්ල මාර්ගය දක්වා වු මාර්ගය කොන්ක්‍රීට් කිරීම නිව්යෝර්ක් ගම්මානයට පිවිසුම් මාර්ගය අදියර එක ඇස්තමේන්තු මුදල ලක්ෂ පහලවය. එක් ගමකට එක් වැඩක් යටතේ ලක්ෂ දහයකුත් ගම නැගුම යටතේ ලක්ෂ පහකුත් අනුමතවේලා තියෙනවා. අම්බලන්ගොඩ කැපුඇළ පාරේ නාමල් ඇළ සඳහා පෙට්ටි බෝක්කුවක් ඉදිකිරීම. එක් ගමකට එක් වැඩක් වැඩසටහන යටතේ අනුමත මුදල ලක්ෂ දහයයි. පටබැඳිපුල්ල දෙවන් හරස් පාරේ ඒ. ඩබ්. ලිලාවති මහත්මියගේ නිවස අසලින් ඇති ඇති කාණුව කොන්ක්‍රීට් ලැලි දමා ප්‍රධාන මාර්ගයට සම්බන්ධ කිරීම කෙළවරේ ආදර්ශ නිවාස දක්වා එක් ගමකට එක් වැඩක් වැඩසටහන යටතේ

ඇස්තමේනතු මුදල ලකෂ දහයයි. මේ සම්බන්ධයෙන් ගැටලුවක් තියෙනවා සෞඛ්‍ය කම්ටුවේදි කිව්වා කොන්ක්‍රීට් ලෑලි දලා මේක වැහුවොත් සුද්ද කිරිමේ ගැටලුවක් ඇති වෙනවා කියලා. ගමේන් ඇවිල්ලා තියෙන යෝජනාව කියන්නේ මේ සමෘදි නියාමක ඉන්නෙත් මෙතනනේ. ඉතින් ඒ ආපු යෝජනාව ඒ ගෙදරට විතරයි ඒකේ අවශ්‍යතාවය. කට්ටිය කැමතිනම් කරන්න. මේක සුද්ද කරන්න ගියහම විශාල ප්‍රශ්නයක් ඇති වෙනවා. පටබැඳිපුල්ල ග්‍රාමසේවක කොට්ඨාශයේ අපි තියපු රැස්විමේ යෝජනා ගැනිමේදි ඒකේ තියෙන්නේ ජල කරාමය ඉස්සරහින් යන පාර කරන්න කියලා පළමුවෙන්ම. කමක් නෑ ඒක අවශ්‍යතාවයක් තියෙනවනම් කරන්න. එඬේරමුල්ල පාර තාර දමා නවිකරණය කිරිම සහ කාණු පද්ධතිය කොන්ක්‍රීට් කර සකස් කිරිම විදුලි බල මණ්ඩලය ළගින් මාර්ගය අවසන් වන කෙළවර දක්වා එක ගමකට එක වැඩක් යටතේ ලක්ෂ පහයි. පනියන්දුව පාර තාර දමා ප්‍රතිසංස්කරණය කිරිම ප්‍රජාශාලාව අසල සිට මාර්ගය අවසානය දක්වා ලක්ෂ පහයි එක ගමකට එක වැඩක් යටතෙ. බෝක්කුවට අමාත්‍යංශයෙන් වෙනමම සල්ලි ආවේ . පනියන්දුව බෝක්කුවට මුදල් අනුමත වෙච්ච ඒකත් ඉදිරිපත් කරන්න. පඤ්ඤාලෝක පටුමග කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරිම පඤ්ඤාලෝක පටුමග ආරම්භයේ සිට රත්නමාලි මහත්මියගේ නිවස දක්වා ලක්ෂ දහයයි එක ගමකට එක වැඩක් යටතෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණි මෙකේ පඤ්ඤාලෝක මාවතේ ප්‍රාදේශිය ලේකම් එකේ නිළධාරින් යෝජනා කරලා තියෙන්නේ පාර දිගට කොන්ක්‍රීට් කරන්න. නමුත් ඒ නිවැසියන් දෙතුන් දෙනෙක් විරුද්ධ වෙලා තියෙවනා ඒකට එයාලා කියලා තියෙන්නෙ නැවතිච්ච තැන ඉදලා කරන්න කියලා. මම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ගියා සභාපතිතුමණි ඒක හරි. මම මේ කියන්න හැදුවේ ඒ නිවැසියන්ගේ ඉල්ලිමට කන් දීලා නිළධාරින් ඒක කරලා තියෙනවා. ඉතිරි ටික අපි නගර සභාවෙන් කරන්න ඕන. නැතිනම් අඩි 20 විතර තිරුවක් ඉතිරිවේලා මිනිස්සුන්ගේ ඉඩම් වලට වතුර යනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

වෙනදා අපි කළේ ඒක තමයි. උදාහරණයක් විදියට ලක්ෂ දහයක් ආණුඩුවෙන් දෙන කොට සම්පුර්ණ ඇස්තමේන්තුව ලක්ෂ විසි හයයි. ඉතිරි ලක්ෂ 16 අපි දුන්නා. ඉතින් එහෙම දෙනවා. දැන් මේකෙදි මේ විගණන ප්‍රශ්නේ නිසා අපිට ගැටලුවක් තියෙනවා. එහෙම නම් වෙනම ඇස්තමේන්තුවකට යන්න වෙනවා.
මිලගට පෝරඹ පාලු වත්ත පාර කොටසක් තාර දමා සකස් කර ගැනිම සහ කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරිම චිත්රා කල්යාණි මහත්මියගේ නිවස අසල සිට පී. එච් . කාන්ති මහත්මියගේ නිවස දක්වා. ඕකන්ද ග්‍රාම නිළධාරි වසම අත්කම් නිවාස පාර කාණු පද්ධතිය දෙවන කොටස කොන්ක්‍රීට් කිරිම පෙර පාසල අසල සිට මාර්ගය අවසානය දක්වා එක ගමකට එක වැඩක් යටතේ ලක්ෂ 4යි. නැවතත් ඕකන්ද ග්‍රාමසේවා වසමේ පඤ්ඤාලෝක අතුරු මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා තාර දැම්ම පළමු අදියර ලක්ෂ 08යි එක ගමකට එක වැඩක් යටතේ ලක්ෂ 06යි ගමනැගුම වැඩ සටහන යටතේ ලක්ෂ 02ක් වෙන් කරලා තියෙනවා. දුව සිසිල් චන්ද මහතාගේ නිවස අසල සිට වන අතුරු මාර්ගය අවසානය දක්වා සංවර්ධනය කිරිම එක ගමකට එක වැඩක් යටතෙ මහ අම්බලන්ගොඩ ග්‍රාම සේවා වසම ලක්ෂ 05යි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමා මෙතුමන්ලා කියනවා තාප්පේ ඉදිකිරිම් කටයුතු කරන්න බෑ කියලා ඒක ඉවත් කරන්න සුදානමක් තියෙනවා.ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තාක්ෂණ සේවා නිළධාරි තමා හෝ තුමියව අපි දැනුවත් කිරිමක් කරන්න ඕන අපේ කලින් ඉදපු වැඩ අධිකාරිතුමාගේ කාලයේ ඉදලා මේවා බෙහොම උපක්‍රමශිලිව කළා සභාපත්තුමණී. අපේ සභාවෙන් අඩුපාඩුවක් සකස් කරනවා කියන දේදි එයාලා කියන්නේ ඒ තාප්පේ ඉදිකිරිම සභාවෙන්ම කරන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

නෑ ඒක තමයි. වෙනදනම් අපි ඔය කාර්යයන් දෙකම එක් අයකුට දීලනේ කරන්නේ. දැන් මේක මෙහෙම කරලා ඒ කෑල්ල අපෙන් කරමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

ඒක ඇත්ත සභාපතිතුමා. රට අමතරව ප්‍රායෝගිකව වැඩක් කිරීම සම්බන්ධයෙන් පොඩි වෙනසක් තියෙනවා. දැන් අපි තාප්පය ඉදිකරන, එක දෙකම රාජ්‍ය ආයතන. මුදල් භුවමාරුව වර්ෂ අවසානය වන විට මුදල් සංසරණය කොහොමත් සිද්ධ වෙනවා. අපි සභාවෙන් ලක්ෂයක් හෝ දෙකක් වියදම් කිරීම කොහොමත් සිද්ධ වෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරින් කියන්නේ ඒකට ඒ මුදල වෙන් කරන්න බෑ කියලා. මේක කපලා ගැහුවත් එකයි ගහලා කැපුවත් එකයි. අවසානයේදී මුදල් ගෙවීම් සිද්ධ වෙලා තියෙන්නේ නියමිත කාල සිමාව තුලදී

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක කරගන්න.

**<u>තීරණය</u>**

☛ **මෙම භූමින් නගර සභාව සතු භූමි බැවින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මෙම කටයුතු සඳහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම වැඩ සටහනට සමගාමීව පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශය යටතේ " දොරින් දොරට - ගමින් ගමට " ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික සැලැස්ම ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය , ග්‍රාමීය පාලම් නවීකරණය හා අළුතින් ඉදිකිරීමේ වැඩසටහන - 2014 වැඩ සටහන යටතේ අම්බලන්ගොඩ මැතිවරණ කොට්ඨාශය සඳහා රු. 30,000,000.00 ක මුදලක් වෙන් කර ඇත අතර මේ යටතේ 84 ඒ පනියන්දූව ග්‍රාමසේවා වසමේ පනියන්දූව පාරේ මානාන ක්‍රීඩා පිටිය අසල ඇති බෝක්කුවට ප්‍රතිපාදන ලැබී ඇත.

**<u>තීරණය</u>**

☞ **මේ සඳහාද ගරු සභවේ අනුමැතිය ලබා දෙන ලදී.**

12.6 " සභාව මගින් ගෙවනු ලබන මුදල ලබා ගැනීම " මැයෙන් නගර සභා සුහද සේවක සේවිකා සුභ සාධක සංගමය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභා සුහද සේවක සේවිකා සුභ සාධක සංගමය මගින් වාර්ෂිකව යනු ලබන විනෝද චාරිකාව 2014. සැප්තැම්බර මස 26,27,28 දින වල යාමට තීරණය කර ඇති බවත් ඒ සඳහා පෙර වසර වල මෙන්ම සභාවෙන් දෙනු ලබන රු.50000.00 ක මුදල ලබාදෙන මෙන් ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අනෙක් සංගමයත් රු.50000.00 ඉල්ලනවා . ඔය දෙගොල්ලොම එක දවසෙද යන්නේ.

**<u>තීරණය</u>**

☛ නගර සභා සුහද සේවක සේවිකා සුභ සාධක සංගමයේ වාර්ෂික චාරිකාව සඳහා රු. 50000.00 ක මුදල ගරු දකුණු පළාත් පළාත් පාලන ඇමතිතුමාගේ අනුමැතියට යටත්ව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**12:7** **'** පැස්සුම් කර්මාන්තය වෙනුවෙන් ගෙවනු ලබන දිරි දීමනාව **'** මාර්ග කම්කරු පී. බුද්ධික චන්දලාල් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පී. බුද්ධික චන්දලාල් යන අය වසර 08 ක පමණ කාලයක් නගර සභාවේ පැස්සුම් කර්මාන්තයේ කටයුතු සිදු කරන බවත් ඒ වෙනුවෙන් රු.100.00 දීමනාවක් ලැබෙන බවත් එය වැඩි කර දෙන ලෙසත් ,මාර්ග කම්කරු තනතුරේ සිටින ඔහුගේ තනතුර පැස්සුම් කරු ලෙස ලබා ගැනීමට කටයුතු කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ තාක්ෂණ සේව නිළධාරිනියගේ නිර්දේශය පරිදි පැස්සුම් කරුගේ දීමනාව රු. 25.00 න් වැඩි කර රු. 125.00 ලෙස ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

12.8 " ආදේශක තනතුරක් ලබා දීම සම්බන්ධවයි " මැයෙන් ප්‍රධාන කළමනාකරණ සහකාර මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පී. එච්. සහන් සංකල්ප යන අයට ආදේශක පොදු වෙළඳ පොල භාරකරු තනතුරක් ලබා දීමට 2014-01-07 දින මාසික සභවේ තිරණ අංක 12:5 යටතේ අනුමැතිය ලබා දී තිබූ බවත් මේ සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා වෙත ලිපියක් යවා ඇති අතර ඒ සම්බන්ධව මෙතෙක් පිළිතුරක් ලැබී නොමැති බවත් ඉහත සභා තිරණය මාස හයක් ගතවී ඇති බැවින් නැවතත් මෙම යෝජනාව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **පී. එච්. සහන් සංකල්ප යන අයට ආදේශක පොදු වෙළඳ පොල භාරකරු තනතුර ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:9** **'** ක්‍රීඩාංගනය පැවරීම සම්බන්ධයෙනි **'** මැයෙන් අම්බලන්ගොඩ ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ ක්‍රිකට් භාර ආචාර්ය කේ. එස්.එස්. ද සිල්වා මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

දේවානන්ද විද්‍යාලය විසින් 2014.05.27 දින ක්‍රීඩාංගනය වෙන් කරන ලද බවත් එම දිනට ක්‍රීඩා තරගයක් නොපැවැත්වූ බැවින් සහෝදර පාසලක් වු පී. ද .එස් කුලරත්න විද්‍යාලයට ක්‍රීඩාපිටිය ලබා දීමට කටයුතු කරන ලද බවත් ඒ වෙනුවෙන් දඩ මුදලක් ගෙවීමට සිදු වු බවත් ඒ පිළිබඳ කණගාටුවන බවත් ඒ පිළිබඳ සාධාරණයක් ඉටු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **මේ සම්බන්ධයෙන් සලකා බැලු සභාව මේ සඳහා මුදල් ගෙවා ඇත්තේ දේවානන්ද විද්‍යාලයේ විදුහල්පති බැවින් සහ ඔහු රාජ්‍ය නිළධාරියෙකු නිසාත් මෙම ක්‍රීඩාංගනය වෙන් කළ දිනය පී. ද .එස් කුලරත්න විද්‍යාලයට ලබා දී ඇත්තේ එම විද්‍යාලයේ ඉල්ලීමක් පරිදි සුහද මාරුවක් ලෙස නිසාත් මේ සඳහා දේවානන්ද විද්‍යාලයට හිලව් දිනයක් ලබා දීමටත් මෙය වෙනත් කිසිදු දෙයකට පුර්වාදර්ශයක් කර නොගැනීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:10** **'**2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 1**'** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 ජුනි මාසයේ වැඩසටහන 1 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:11** **'** 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 2**'** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 ජුනි මාසයේ වැඩසටහන 2 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:12** **'** 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 3**'** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 ජුනි මාසයේ වැඩසටහන 3 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:13** **'** 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 5 **'** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 ජුනි මාසයේ වැඩසටහන 5 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

තීරණය

☞ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:14** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම වැඩසටහන 6 ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 මැයි මාසයේ වැඩසටහන 6 හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:15** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම විවිධ ගිණුම් ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 ජූනි මාසයේ විවිධ ගිණුම් හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:16** ‘ 2014 - වැය විස්තර මාසික සභාවට ඉදිරිපත් කිරීම පොදු ගිණුම - වෙනත් ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

2014 ජූනි මාසයේ පොදු ගිණුම - වෙනත් හි වැය විෂයන්ගේ වැය වීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:17** ‘ බැංකු ගාස්තු ගිණුම් ගත කිරීමට අනුමැතිය ලබා ගැනීම ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන පොදු ගිණුම සඳහා පහත පරිදි බැංකු ගාස්තු අයකර ගෙන ඇති බවත් එහි මුළු වටිනාකම වන රු. 903.04 ක මුදල වියදම් වශයෙන් ගිණුම් ගත කිරීමට සහා අනුමැතිය ඉල්ලා තිබුණි.

| පොදු ගිණුම | බැංකු ගාස්තු | තැපැල් ගාස්තු | VAT | NBT | බැංකු අයිරා පොලිය | එකතුව |
|---|---|---|---|---|---|---|

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2014 ජනවාරි මාසය | 70.00 | 40.0 | 13.46 | - | - | 123.46 |
| 2014 පෙබරවාරි මාසය | - | - | - | 2.24 | - | 2.24 |
| 2014 මාර්තු මාසය | 70.00 | - | 13.46 | - | - | 83.46 |
| 2014 අප්‍රේල් මාසය | - | - | - | 2.24 | - | 2.24 |
| 2014 මැයි මාසය | - | - | - | - | 568.18 | 568.18 |
| 2014 ජුනි මාසය | 70.00 | 40.00 | 13.46 | - | - | 123.46 |
| | 210.00 | 80.00 | 40.38 | 4.48 | 568.18 | 903.04 |

**තීරණය**

☛ **බැංකු ගාස්තු ගිණුම් ගත කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:18** **‘** 2014 ජුනි මස වාර්තාව **’** මැයෙන් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ සංයෝජක විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ආයතනයෙහි සායන පැවැත්වූ දින ගණන 21 ½ ,ආයතනයට පැමිණි රෝගීන් ගණන 212, රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 10, මාසය සඳහා වැය වු ඖෂධ වල මුළු වටිනාකම රු.25537.62, රෝගියෙක් සඳහා වැය වු මුදල රු. 120.46 ලෙස සඳහන් තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:19** **‘** 2014 ජුලි මස වාර්තාව **’** මැයෙන් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ඖෂධ සංයෝජක විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ආයතනයෙහි සායන පැවැත්වූ දින ගණන 21 ½ ,ආයතනයට පැමිණි රෝගීන් ගණන 231, රෝගීන් පැමිණීමේ දෛනික සාමාන්‍ය 11, මාසය සඳහා වැය වු ඖෂධ වල මුළු වටිනාකම රු.25294.84, රෝගියෙක් සඳහා වැය වු මුදල රු. 109.50 ලෙස සඳහන් කර තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:20** **‘** ආදායම් හිඟ ශේෂ වාර්තා 2013/2014**’** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

2014 වර්ෂයේ ජනවාරි සිට ජුනි මස දක්වා අම් /නස / 02 / 04 විෂයට අදාළ අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කොට තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**12:21** **‘** ආදායම් හිග ශේෂ වාර්තා 2013/2014**’** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

2014 වර්ෂයේ ජනවාරි සිට ජූනි මස දක්වා අම් /නස / 02 / 05 විෂයට අදාළ අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කොට තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**12:22** **‘** ආදායම් හිග ශේෂ වාර්තා වරිපනම් 2013/2014**’** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

2014 වර්ෂයේ ජනවාරි සිට ජූනි මස දක්වා අම් /නස / 02 / 02 විෂයට අදාළ අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කොට තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**12:23** **‘** ආදායම් හිග ශේෂ වාර්තා වරිපනම් 2013/2014**’** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

2014 වර්ෂයේ ජනවාරි සිට ජූනි මස දක්වා අම් /නස / 02 / 06 විෂයට අදාළ අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කොට තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**12:24‘** ආදායම් හිග ශේෂ වාර්තා වරිපනම් 2013/2014**’** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිගොනුව සභාගත කරන ලදී.

2014 වර්ෂයේ ජනවාරි සිට ජූනි මස දක්වා අම් /නස / 02 / 03 විෂයට අදාළ අය ශීර්ෂ යටතේ ඇස්තමේන්තුගත ආදායම ඇතුලත් වාර්තාව ඉදිරිපත් කොට තිබුණි.

**තීරණය**

☛ **මෙම වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**12:25** ' කොරියානු කටු චිකිස්සාව සඳහා කටු ගෙන්වීම ' මැයෙන් ප්‍රජා සංවර්ධන නිළධාරිනිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ සේවය කරන ලද වෛද්‍ය මොනිකා විතානගේ මහත්මියගේ කාලයේදී කොරියන් කටු චිකිස්සාව සඳහා අවශ්‍ය කටු ලබාදීමට අනුමැතිය ලබාදී තිබූ බවත් එම කටුවලට සිදු වූයේ කුමක්ද පිළිබඳ 2014/07/01 දින සභාවේදී විමසන ලද බවත් මෙම කටු චිකිස්සාව සිදු කිරීමට සියලු උපාංග ලබාදීමට සභාවේ අනුමැතිය ලබා දී තිබුණද මිලදී නොගත් බව සැපයුම් නිළධාරිණිය සඳහන් කරන අතර නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට පැමිණි රෝගීන් සඳහා කටු චිකිස්සාව සිදු නොකරන ලද බව වෛද්‍ය තුමිය විසින් සඳහන් කරන ලද බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම ලිපිය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් තරන ලදී.**

**12:26** **'**අනු බෙදීම් අංක 2003/97 යටතේ අනුමත අනුබෙදුම සම්බන්ධවයි**'** මැයෙන් 86 ඩී තල්ගස්ගොඩ එක්සත් සුභ සාධක සමිතියේ උපසභාපති ඒ. වී.සෝමරත්න මහතා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2003/97 අංක යටතේ පී. එච්. ඉන්දාණි මහත්මිය විසින් ඉදිරිපත්කර ඇති අනු බෙදුම තල්ගස්ගොඩ ඩිපෝව ඉදිරිපිට ඇති ක්‍රීඩා පිටිය හරි මැදින් යන ආකාරයට අඩි 10 ක් පළලට අඩි 300 පමණ දිගට පිඹුරු අංක 95/2001 යටතේ ඉදිරිපත් කර ඇති පිඹුරු පත අප සමිතියට අයිති (ක්‍රීඩා පිටිය) ඉඩම මතින් ව්‍යාජ ලෙස සකසා එම පිඹුරු පතෙහි බී අක්ෂරය යටතේ පර්චස් 10.81 විශාල බිම් කැබැල්ලක් බවත් 2003 දී අනුමත කරන ලද මෙම මාර්ගය වසර 11 පසුව කිසිදු දැනුම් දීමකින් තොරව ක්‍රීඩා පිටිය මතින් මාර්ගයක් සාදා ගැනීමට යාමේදී 2014.07.21 දින තිලකපුර පොලිසියට පැමිණිලි කිරීමෙන් පසුව අප ක්‍රීඩා පිටිය මතින් ව්‍යාජ ලෙස සකස් කළ පිඹුරුපතක් මගින් බී නම් අක්ෂරය යටතේ ඇය සතු බවට පොලිසියට ඉදිරිපත් කරන ලද බවත් එය අම්බලන්ගොඩ නගර සභාවේ 2003/97 යටතේ අනුමත කර ඇති බවත් මෙම ඉල්ලුම්කාරිය විසින් 2003.09.21 දින ඉදිරිපත් කරන ලද ලිපියේ සඳහන් පරිදි සුදුවැල්ල පාරේ අඩි 70 ගිය පසු බස්නාහිරට සම්බන්ධ අඩි 15ක් පළල පාරක් නිවසට යාමට ඇය පාවිච්චි කළ බවත් එම මාර්ගයත් 95/2001 පිඹුරේ පැහැදිලිව පෙන්වා දී තිබියදී සභාවේ නිළධාරීන්ද නොමග යවා ඇති බව සිතන බවත් සම නිසාවෙන් සමිතිය සතු ක්‍රීඩා භූමිය බේරාදෙන ලෙසත් ඉල්ලා තිබුණි.
ඒ අනුව පී. එච්. ඉන්දාණි මහත්මිය විසින් ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර අනුමත කරන ලද අනුබෙදුමට සහය දුන් නිළධාරීන්ට විරුද්ධව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවද සඳහන් කර තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2007/ 97 ගොනුව මේ තල්ගස්ගොඩ පිට්ටනිය උඩ ඉඩම. තාන්ෂණික නිළධාරින් විසින් තමයි මෙම ප්‍රශ්නය ඇති කරලා තියෙන්නේ. එයාලගේ සැලසුම් කමිටුවට දන්වපු එකෙත් එයාලා සඳහන් කරලා තියෙන්නේ ඉදිරිපත් කරපු මහ නගර සභා සැලැස්මේ දක්වා ඇති ඉඩම තල්ගස්ගොඩ පාරේ සිට අඩි 300 ක් පමණ දුරක ඇත. නවද මෙම දකුණු නැගෙනහිර මායිමේ අඩි 15 ක පමණ මාර්ගයක් ද වේ . මෙම පාර සුදුවැල්ල පාර තෙක් ඇත. මේ ඉඩමට වරිපනම් අංකයක් ලබා දී ඇත්තේ තල්ගස්ගොඩ පාරට අයත්වය. එබැවින් පාරේ සිට ඉඩමට ප්‍රවේශ වන දකුණු දිශාවට ඇති පාර නිවරදිව සඳහකන් කර ඉදිරිපත් කරන ලෙස දන්වා යැවීම සුදුසු යැයි කියා අපේ TO කියනවා. මෙයාට තල්ගස්ගොඩ පාරෙන් අංකයක් දිලා තියෙන නිසා සුදුවැල්ල පාරෙන් නොවන නිසා අර ඉඩම මැදින් පාරක් ඇදලා පෙන්නන්න කියලා තමයි මේ වැඩේ කරලා තියෙන්නේ. එම නිසා පාරක් ඇදලා ඉදිරිපත් කරලා තියෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මමත් බැලුවා මේ ගොනුව. ඇත්තටම මේ තැනැත්තියට පාරක් සුදුවැල්ල පාරෙන් තියෙනවා. එහෙම තියෙද්දි තමයි මේක අනුමත කරලා තියෙන්නේ.මං හිතන්නේ බලාපොරොත්තුවක් ඇතිව තමයි එහෙම කරලා තියෙන්නේ. සභාපතිතුමා ජනිත් මන්ත්‍රීතුමා එහෙම හොඳටම දන්නවා අපට සෙල්ලම් කරන්න තැනක් නැතිව ඉන්න කොට තමයි මේ ඩිපෝ හන්දියේ ඉඩම් කැබැල්ල අපට ලබා දුන්නේ. එවකට මේක අයිති CTB එකට. CTB එකට අක්කර හයක් අරන් ඉතිරි කොටස අපට දුන්නේ. ඒ අනුව තමයි ඔය ක්‍රීඩා පිටිය සංවර්ධනය කළේ . මම ලිපි ගොනුව පරීක්ෂා කිරීමේදී එකේ තියෙනවා 2003 අනු බෙදුම ඉදිරිපත් කළහම ප්‍රතික්ෂේප වෙලා තියෙනවා මොනයම් හෝ හේතුවක් උඩ. TO මහත්තයා නිර්දේශ කරලා තියෙනවා මෙන්න මේ විදියට අඩි 300 ක් දිගට අඩි 10 පළලට බිම් කැබැල්ලක් මගින් මේක ආපසු පිඹුරු පතකින් ඉදිරිපත් කරන්න කියලා. ඉතින් ඒ අනුව ඇඳලා පිඹුරු පතක් ඉදිරිපත් කරලා තියෙනවා. එතකොට මේ සැලසුම් කමිටුව බලන්න ඕන මෙහෙම ප්‍රතික්ෂේප කරපු එකක් ආපහු කමිටුවට එන කොට මේ පිඹුරුපත කලින් එකද තිබ්බ්ච නැති බිම් කොටසක් එකතු කරලා පර්චස් 10.81 මට මතක විදියට . ඒක එකතු කරලා දුන්නහම ඒකට ඔප්පුවක් නැතිද කොහොමද මෙහෙම අනුමත කරන්නේ කියලා. කිසිම හේතුවක් නැතිව මේක ඉතාමත් කූට විදියට එවකට හිටපු නිළධාරීන් විසින් සභාපතිතුමන්ව නොමග යවලා මේක කරලා තියෙන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
සභාපතිතුමන් කීවම මම නෙවෙයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**
නෑ ඔබතුමන් නෙවෙයි. එවකට හිටපු සභාපතිතුමන් . මං හිතන්නේ එතුමත් එහෙම කරන කෙනෙක් නෙවෙයි. මේ සභාවේ හිටපු ගරුත්වය තියෙන සභාපතිකෙනෙක්. නිළධාරීන් එතුමත් නොමග යවලා තමයි මේක කරලා තියෙන්නේ. විශේෂයෙන්ම මේකට TO මහත්තයා තමයි නිර්දේශය දීලා තියෙන්නේ මෙහෙම කරන්න කියලා. ඉතින් ඒ විදියට අර තැනැත්තිය ඉදිරිපත් කරලා තියෙනවා. ඒ අනුව සැලසුම් කමිටුව අත්සන් කරලා අනුමත කරලා තියෙනවා. ඒක සම්පූර්ණ වැරදි වැඩක් සභාපතිතුමණි. අයිතියක් නැති දෙයක් එහෙම ලබාදීම සම්බන්ධයෙන් දැන් මුළු ගමක්ම එක පැත්තක් වෙලා තියෙන්නේ . මටක් දෝෂාරෝපනය කරනවා මමත් උදව් කරනවා කියලා. මගේ කිසිම උදව්වක් නෑ. මං අපේ ගරු මන්ත්‍රීතුමන්ලට දැන ගැනීමට ප්‍රකාශ කළේ. එනිසා ඔබතුමන් මේ සම්බන්ධයෙන් සමිතිය ඉල්ලලා තියෙන ආකාරයට කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමණි.

**ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි මහතා කතා කරමින්**
අපේ උප සභාපතිතුමා පැහැදිලි කළ ආකාරයට එක්සත් සුහ සාධක සංගමයේ සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය මත සභාපතිතුමණි පැහැදිලිවම පොදු කටයුතු සඳහා යම් අසාධාරණයක් කූට ලෙසත් වංචාසහගතව ලෙසත් සංවිධානාත්මකව කළයි කියලා අදහසක් අපට තියෙනවා. දැන් මේ කියන කාරණය අනුව අදාල නිවැසියන්ට ප්‍රවිශ්ට වීමට මාර්ගයක් තියෙන හෙයිනුත් ඊට අමතරව මේ ඉදිරිපත් කරලා තියෙන ලිපි ලේඛන වල සත්‍ය අසත්‍යතාවයත් සලකලා බලලා එක්සත් සුහ සාධක සංගමයේ සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සාමාන්‍යයෙන් පොදු ඉල්ලීමක් වීමට ගොඩක් දුරට ඉඩ තියෙනවා සභාපතිතුමණී . ඒ සම්බන්ධයෙන් සමිතියේ පාර්ශවයෙන් සාධාරණයක් ඉටුකරන ලෙසත් අදාල නිවැසියන්ගේ මාර්ගය සම්බන්ධයෙන් ප්‍රවිශ්ට වීමේ ඉඩකඩ කියෙන බැවින් ඒ සම්බන්ධ අදාල කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමණි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
තාරත් දාලා තියෙන්නේ අඩි 15

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්**

මේ පිඹුරේ බිම් කැබැල්ලක් තමයි පෙන්නුම් කරලා තියෙන්නේ . පර්චස් 10.82 ක් කියලා තියෙනවා මේ ප්ලෑන් එකේ. ඒක එයාට අයිතියක් නෑ. එතකොට පාර මේ ප්ලෑන් එකට තියෙන ප්ලෑනක්. මමත් දැන් තමයි දැක්කේ සභාපතිතුමණි. ජනිත් මන්ත්‍රීතුමා බලන්න මේ මොකක්ද කියලා. මේක ඇත්තටම හරිම කුට විදියට කළ පහත් වැඩක්. මේක දැන්වත් නිවරදි කරන්න මොකක් හෝ කරන්න කියලා තමයි කියන්නේ. මොකද මමත් දැන් දැකපු නිසා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධයෙන් අපි පළාත් පාලන විමර්ශන නිළධාරි සහ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් නිළධාරිතුමාට ඉදිරිපත් කරලා ඒකාබද්ධ කාර්තාවක් සභාවට දෙන්න කියමු මොකක්ද කරන්න අවශය කියලා.....මෙහේ නිළධාරින් බෑනේ. පළාත් පාලන විමර්ශන නිළධාරි සහ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් නිළධාරිතුමාගේ වාර්තාව අනුව සභාව ඉදිරියට කටයුතු කරනවා.

**තීරණය**

☛ **පළාත් පාලන විමර්ශන නිළධාරි සහ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් නිළධාරිගේ ඒකාබද්ධ විමර්ශන වාර්තාවක් ලබාගෙන ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට සභාව තීරණය කරන ලදී.**

✪ වෙනත් කරුණු

**ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි මහතා කතා කරමින්**

ගරු සභාපති තුමණි ,මාසික ගෙවීම් සම්බන්ධ කාරණයක්...මාසික කමිටු දීමනාව ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාපති තුමණි.මාස කිහිපයක්ම රු. 50 තිබුණේ. මම ගියවර ගත්තෙත් නෑ. මාසික කමිටු වාර්තාවලට සහභාගී වීම මත ගෙවීමේ ක්‍රමයේ වෙනසක් සිදු වී ඇද්ද ගරු සභාපතිතුමණි

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමි හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්**

මාස කිහිපයක්ම රු. 50 තිබිලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි මහතා කතා කරමින්**

මාස කිහිපයක්ම මං උනන්දු වුනේ නෑ ගන්න මං හිතුවා මගේ අඩු පැඩුවක්ද කියලා ..........පසු ගිය සභා වාරයේදී අපි තීරණය කළා අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කිරීමෙන් පසුව පළාත් පාලන ආයතන සම්බන්ධ කොළඹ විශ්ව විද්‍යාලය සම්බන්ධයෙන් වෛද්‍යවාර්තාවක් දෙන්න අවශ්‍ය නෑ කියලා.මං හිතුවේ මගේ අඩුපාඩුවක් කියලා. මං සභා වාර දෙකකට කලිනුත් ඇහුවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඉතින් මන්ත්‍රී තුමා මේක කලින්ම අහන්න තිබුනනේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රු. 1000 ක් මොකක්ද කපලා තියෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි මහතා කතා කරමින්**

අප්‍රේල් මාසේ 01 එකට තමයි ආවේ නැත්තේ. දැන් මැයි ජුනි ජුලි අගෝස්තු සැප්තැම්බරුත් වෙලානේ.නෑ සභාපති තුමා අපි ඒ තීරණයේත් වෙනස් කිරීමක් කළ යුතුයි. ......නෑ සභාපති තුමා ඉන්ධන දීමනාව ලෙස එය නැවත ලැබෙනවනේ......මෙය සියලු මන්ත්‍රීවරුන්ට පොදුයි...

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ජනිත් මන්ත්‍රීතුමා මෙය කලිනුත් මතක් කළා. රාජ්‍ය සේවකයෙක් වශයෙන් ඡන්දය ඉල්ලලා ආපහු ගිහින් කීවම පඩිය දෙනවා. නමුත් මන්ත්‍රීවරුන්ට  එම වරප්‍රසාදය නෑ. රජයේ සේවයේ තියෙනවා. රජයේ සේවකයකුට තියෙන අයිතියවත් මන්ත්‍රී කෙනෙකුට නෑ. නිළධාරින් දැන් උත්තරයක් අරන්නේ. සභා දවසට ආවේ නැත්නම් 162 කපලා ඉතිරිගාන ගෙවන්න.හිග වැටුප් ගෙවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමණි මේකේ අපහැදිලි තැන් තියෙනව.  උදාහරණයක් විදියට අද සම්බන්ධීකරණ කමිටුව තියෙනවා. ඒක උදේ තිබුණනම් අපි සම්බන්ධිකරණ කමිටුවට යන්න ඕනනේ. එතකොට මේ කාරක සභාවද වැදගත් සම්බන්ධීකරණ කමිටුවද. මන්ත්‍රීවරු කියන්නේ මහජන ඡන්දයෙන් පත්වන අය. ඉතින් හදිසියේ මරණයක් සිදු වුණා. මම මරණය ගන්න රෝහලට යන එකද වැදගත් මේ කමිටුවට සහභාගි වන එකද. අපි මහජන නියෝජිතයෝ. අපට රෝහලකට පැය විසිහතරම යන්න පුලුවන්. කමිටුව වුවමනාවෙන් මග හරින එක නෙවෙයි මං කියන්නේ. මේක දීමනාවක් දෙන්නේ . වැටුපක් නෙවෙයි. දිමනාව කොහොමද අනුපාතයට බෙදන්නේ. ගරු සභාවේ මහ රැස්වීමට සහභාගි වීමයි කමිටුවකට සහභාගි වීමයි එක සමාන වෙන්න පුලුවන්ද. නගර සභාවේ පැවැත්වෙන අනෙකුත් උත්සව වලට සහභාගී වීම කමිටු වලට අදාල නැද්ද. ප්‍රායෝගික ගැටලු ගොඩක් තියෙනවා. සභාවේ ආරක්ෂාවට සභාපතිතුමන් විසින් ඉල්ලීමක් කරලා තියෙනවනම් සහභාගීත්වය අඩුයි මේ දීමනාව ගෙවීමේ වෙනසක් කරන්න කියලා ඒක වෙනම කාරණාවක්. කම්කරුවන්ටත් වඩා අඩු දීමනාවක් මේ ලැබෙන්නේ. ඒකත් අඩුකරනවා කියන්නේ ලැජ්ජ සහගත දෙයක්. අවංකවම ලංකාවේ රාජ්‍ය සේවයේ අවම වැටුප් ලබන්නේ මන්ත්‍රීවරු. මම දීමනාව ගන්න කෙනෙක් නෙවෙයි . මම මේ කතා කරන්නේ සියලුම මන්ත්‍රීවරු වෙනුවෙන්. මෙවැනි චක්‍ර ලේඛ නිර්මාණය කරන්නේ කොහොමද කියන එක අපට ගැටලුවක්. මම නීතියට එකගයි. නීතියට මම හිස පහත් කරනවා. නමුත් මේවා නිවරදි කරන්න. අති ගරු ජනාධිපතිතුමා අද අපිව කැදවලා තිබුණනම් අරලියගහ මන්දිරයට එතකොට අපි යන්නේ ඒ උත්සවයටද මේ කාරක සභාවටද.එනිසා මන්ත්‍රීවරුන්ගේ දීමනාව සම්බන්ධයෙන් මෙවැනි තීරණ වලට යන්න එපා කියලා දන්වන්න මේ ගරු සභාවේ මතයක් විදියට. මොකද මන්ත්‍රීවරයෙක් මේ සභාවට නාවට ඔවුන් පැය විසිහතරම ජනතා සේවය කරනවා. ඒකටයි මේ දීමනාව ගෙවන්නේ. සභාවේ වාඩි වෙනවට නෙවෙයි.ඒමනිසා මේ කාරණා දෙක දන්වන්න. මොකද මෙහෙම ගියොත් සභික දීමනාව නැතිවෙලා යාවි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

මේක මෑත කාලෙදි ආපු චක්‍ර ලේඛයක්.ඒකට හේතු සාධක ඇත්තටම පෙනුනා.අපේ නගර සභාවේ හැමදාම 100% වගේ සහභාගි වනවා. නමුත් සමහර ප්‍රාදේශීය සභා වල මන්ත්‍රීවරු සභාවට එන්නෙත් නැතිව දීමනාව ගන්නවා.එතකොට සභාව ගෙනියන්න බැරි තත්වයට පත්වෙච්ච තැන් තිබුණා. මේක හරහා තමයි මේ ගැසට් නිවේදනය නිකුත් කළේ පළාත් පාලන ආයතනයෙන්. කලින් ආවත් නාවත් දීමනාව ගෙවුවා. දැනට වසර 2 -3 කට කලින් තමයි මේ චක්‍ර ලේඛය ආවේ.මේ ගැසට් එකේ ඇත්තටම අඩුපාඩු තියෙනවා. මේ කතා කරන්නේත් ඒවා තමයි. අපට පුලුවන් දන්වන්න මේ වගේ ගැටලු පවතින නිසා මේ ගැසට් නිවේදනයේ සංශෝධනයක් දාන්න කියන්න.මොකද මේක මොන පළාත් සභාවක් ආවත් ඉදිරියටත් වලංගු වනවා.මැතිවරණයකට ඉදිරිපත් වීමෙදි රජයේ සේවකයෙක් ඔහුට පුලුවන් ඉතිරි වැටුප පෙන්වලා පඩිය ගන්න. මං අරන් තියෙනවා. ජනිත් මහත්මයා අරන් තියෙනවා. මෙතනදි පළාත් පාලනයේම මන්ත්‍රීකෙනෙක් පළාත් සභාවේ ඡන්දයට ගිහින් මේක නැති වෙනවා කියන්නේ ඒක අසාධාරණයි. එතනදි ඡන්දයෙන් දිනුවා හෝ පැරදුනා මේ දීමනාව ලැබෙන විදියට මේක සංශෝධනය කරන්න ඕන.අපි ගණකාධිකාරිතුමාට කියමු මේ වගේ ප්‍රශ්න එන කොට ඒවා සභාවට යොමු කරන්න

අපි සභාවෙන් යෝජනාවක් විදියට ගරු පළාත් පාලන ඇමතිතුමාගෙන් ඉල්ලමු මෙන්න මේ වගේ ගැටලු තිබෙන නිසා ගැසට් නිවේදනයේ සංශෝධනයක් කරන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගර සභාව සම්බන්ධයෙන් එවැනි ඉල්ලීමක් කිරීම අවශ්‍ය නෑ. මොකද මන්ත්‍රීවරු හැමදාම 100% වගේ සහභාගිවනවා මුදල් මත නෙවෙයි තියෙන අවශ්‍යතාවය මත. එහෙම විශේෂත්වයක් කරනවනම් ඉල්ලීමක් කළාට කමක් නෑ සමස්තයක් විදියට සියලුම පළාත් පාලන ආයතන වෙනුවෙන්. ප්‍රධාන සභා වාරයට පැමිණෙන්නැත්නම් රු. 1000 හෝ 500 කපන්න කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හරි විදියටනම් මන්ත්‍රීතුමාගේ සම්පූර්ණම වැටුපම ගෙවන්න ඕන. මොකද මන්ත්‍රීතුමා එදා ගියේ පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා එකේ අවසාන සහතික පත්‍රය ගන්න. සභාවෙන් මුදල් කොටසක් ගෙවලා ඒක ඉගෙන ගන්න යැවුවේ.ඒකත් පළාත් ගපාලන විෂය සම්බන්ධ කාරණයක්. මන්ත්‍රීවරුන්ගේ මේ ගැසට් නිවේදනය සම්බන්ධ යෝජනා තියෙනව නම් පෞද්ගලිකවම ඒවා ලබලා දෙන්න.එතකොට අපි ඒක සභාවේ දෙයක් විදියට කතා කරලා අවශ්‍ය විදියට වෙනස් කරලා යවමු.තමන්ට වෙච්ච අත්දැකීම් අනුව ලබන සභාවට කලින් එවන්න.

**ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි මහතා කතා කරමින්**

දැන් එදිනම මම විමසුවම කිව්වේ වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කිරීම ගැන කිවම මම කිව්වේ මම එහෙම වංචාවක් කරන්න අවශ්‍ය නෑ කියලා. ඒක නොලැබීමේ චේතනාව මත හිටියා. රට මාස දෙකකට පමණ පසු දේවි මන්ත්‍රීතුමාගේ වෙනත් කාරණයක් සම්බන්ධයෙන් කතා කරද්දි තමයි මේක කතා කළේ. බෙරුවට වෛද්‍ය වාර්තාවක් ඉදිරිපකර කර මේක ලබා ගැනීමේ ක්‍රම වේදය තවමත් තියෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීවරුන් වෙන වෙනම තමන් මුහුණ දීපු ප්‍රශ්න අනුව යෝජනා ලිඛිතව ඉදිරිපත් කරන්න. අපි මේක කතා කරලා යෝජනාවලියක් ඉදිරිපත් කරමු.

**ගරු නගර සභා මන්ත්‍රී අනුර කිත්සිරි මහතා කතා කරමින්**

මම උඩට පැමිණෙන්දි එන්. ඩබ්. එස්. එස් . මල්කාන්තිද සිල්වා මහත්මිය මේ ලිපිය මට ලබා දුන්නේ.නගර සභා ක්‍රීඩාංගනය ඉදිරිපිට නිටා මහත්මියගේ පෙර පාසල ඉදිරිපිට ගසක් සුළගට බොහොම අනාරක්ෂිත ආකාරයෙන් තියෙනවා කියලා. ඔවුන් ප්‍රකාශ කළේ ගහ ඉවත් කිරීමමත් නොවේ ආරක්ෂිත තත්වයකට පත් කරන්න කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නියෝගය දීලා තියෙන්නේ.

**තීරණය**

- **අම්බලන්ගොඩ , ඇල්පිටිය පාර, අංක 34 ලිපිනයේ පදිංචි එන්. ඩබ්. එස්. එස් . මල්කාන්තිද සිල්වා මහත්මියගේ ඉල්ලීම අනුව අවධානම් ගස සම්බන්ධයෙන් තාක්ෂණසේවා නිළධාරිගේ නිර්දේශය පරිදි ලබා දී ඇති නියෝගය අනුව කටයුතු කිරීමට සභාවේ අවසරය ලබා දෙන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්**

සභාපතිතුමා අද මහපන්සල ළග නිවාස යෝජනා ක්‍රමය ගැන න්‍යාය පත්‍රයට තිබුණා. මට ඇත්තටම ඒ අවස්ථාවේ එන්න බැරි වුණා. මට ඒ පිඹුරු පත හමුවුනා. මං සභාවට පොඩි යෝජනාවක් කරනවා මේ 10 දෙනාටම, මේ 13 සහ 12 යන කැබලි දෙක පොදු අවශ්‍යතා සඳහා තමයි වෙන් කරන්න ඇත්තේ එදා ආනන්ද මහත්මයා ඉන්න කාලේ දීපු නිවාස. ඒක නිසා සභාපතිතුමා දැන් ඔය ආරවුල් එන්නේ මේක නිකං තියෙන නිසා. දැන් මම යෝජනා කරන්නේ මේ දෙක අපට බැරිද සභාපත්තුමා දැන් මෙතන මරණයක් එහෙම වුනහම මෙතන තමයි ටෙන්ට් එකක් ගහන්න තියෙන්නේ. එනිසා අපට බැරිද

මෙතනට ගල් කුට්ටි ටිකක් අල්ලලා එතන පොඩ්ඩක් ඒ දෙපැත්ත පිරිසිදු කළානම් ඔය ගැටුම නෑ. එතකොට ගෙවල් වල මිනිස්සු මායිම් වලට රණ්ඩුවෙන්නෙත් නෑ. අලංකාරයකුත් තියෙනවා. 13 කැල්ලේ පර්චස් 5.44ක් 12 කැල්ලේ පර්චස් 4. 37 ක්. ඒ කියන්නේ අර ගෙවල් ඔක්කොම තරම්ම වගේ ප්‍රමාණයක්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එහෙනම් ගෙවල් දෙකක් හදලා දෙමු.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂම් හේමන්තා සිල්වා මෙනවිය කතා කරමින්**

එහෙමත් බැහැනේ සභාපතිතුමා ටෙන්ට් එකක්වක් ගහන්න විදියක් නැනේ. එනිසා මම කියන්නේ මෙතන ගල් කුට්ටි ටිකක් අල්ලලා අලංකාර කලා නම් පොදු කටයුතු වලදී ටෙන්ට් එකක් ගහ ගනීවි. වාහනයක් නවත්ත ගනීවි. පිඹුර මෙහේ තියෙනවානේ.

**තීරණය**

☞ **ගල් කුට්ටි අතුරා අලංකාර කිරීමට ඇස්තමේන්තුවක් සකස් කිරීමට සභාව තීරණය කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

පින්නදුව ,ඩබ්. පී. ලලිත් ශාන්ත මහතා විසින් පින්නදුව පටුමග පාර සකස් කර දෙන මෙන් ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාවට ඉදිරිපත් කරමින් ,මේකේ තියෙන්නේ පාරක් අලුත් වැඩියා කර ගැනීමක්. පින්නදුව පටුමග නගර සභාවට අයිති පාරක්. අප ගෙවත්තට යන පාර වසර 20ක් 25ක් කැලේ වැවී තිබුණි. එම නිසා වෙල් යායේ සිරි නැරඹීමට එන සංචාරකයින් හා ගමේ තරුණයින්ද වෙල් යායට එක්ව ඇළේ සිටින මාලුන් හා වෙල් යායේ සිරි නරඹයි. වෙල් යායට යන පාර කැලේ වැවී ඇති නිසා සංචාරකයින් මාගේ නිවස ඉදිරිපිටින් ගමන් කරයි.මං දන්නෑ යනවද කියලා. එනිසා මට අලාභහානි සිදුවේ.මගේ වගාවන් හා ගස් වලට හානි සිදුවී ඇත.විවිධ උපකරණද නැති වී ඇත. ඒක හින්දා මේක පිළිසකර කරදිලා මිනිස්සු වත්ත උඩින් යන එක නවත්තලා දෙන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්නියගෙමහතා කතා කරමින්**

සභාපතිතුමා ඔය කියන්නේ ආරියපාල විදුහල්පතිතුමාගේ නිවස අසලින් පින්නදුව පටුමගේ චුලනාත මහත්මයාගේ ගේ ඉදිරිපිට එක්කෙනා තමයි ඔය ලලිත් ශාන්ත කියන්නේ. අල්ලපු වත්තේ අය තමන්ගේ මායිමේ කොටසක් අල්ලලා කියන එක. එනිසා පාර නිවරදිව මායිම් ස්ථාපනය කරන්න කියලා තියෙන්නේ. එයා සංචාරක කතාවකුත් දාලා තියෙනවා. නමුත් අපි තාක්ෂණසේවා නිළධාරිනිය යවලා ඒ කියන තත්වය පරික්ෂා කරලා බැලුව නම් හරි සභාපතිතුමා. අඩි 3 නෙවේ අඩි 12 විතර පාරක් . අපට පෙනුමට නම් එහෙම දෙයක් නෑ.

**තීරණය**

☞ **තාක්ෂණසේවා නිළධාරිගේ වාර්තාවක් ලබා ගැනීමට සභාව තීරණය කරන ලදී.**

**ප. ව. 12.20 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

| | |
|---|---|
| එස්,නිර්මලාදා සිල්වා | ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්, |
| ලේකම් (වෙනුවට) , | සභාපති, |
| අම්බලන්ගොඩ නගර සභාව. | අම්බලන්ගොඩ නගර සභාව. |

**2014 – 08 – 05 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**